කාර්යසාධන වාර්තාව

2023

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ජය මාවත, කටුබැද්ද, මොරටුව.

දුරකථන අංකය : **011-2044860**

ෆැක්ස් අංකය : **011-2044879**

වෙබ් අඩවිය : **http://www.csd.lk**

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂය සඳහා වන ප්‍රගතිය පිළිබඳව කාර්ය සාධන වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

මෙම දෙපාර්තමේන්තුවේ වර්තමානයේ බලකා 24 කින් පුහුණු පාසල් 04 කින් සහ විශේෂ ව්‍යාපෘති 03කින් මුළු ශ්‍රී ලංකාද්වීපය පුරා පැතිරයමින් 33250කට ආසන්න හට සංඛ්‍යාවකින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම පරිපූරක හමුදාව වශයෙන් තිස්වසරක කුරිරු යුද්ධයේ පශ්චාත් අවධිය තුළ රට නැවත ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියට තම දායකත්වය ලබාදෙමින් සිටියි. ශ්‍රී ලංකාව පුරා ඉතාමත් ශක්තිමත්ව විහිදුනු මෙම දෙපාර්තමේන්තුව තම ප්‍රධාන රාජකාරීන්ට අමතරව කෘෂිකාර්මික ව්‍යාපෘතීන් සඳහා ප්‍රධාන ලෙස සක්‍රීයව දායකත්වය සපයන අතර ශ්‍රී ලංකා කජු නිෂ්පාදනයේ පුළුල් මෙහෙයක් ඉටුකරමින් අපනයන බෝග ශ්‍රී ලංකාව තුළ වර්ධනය කිරීමට ද වර්තමානයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් ක්‍රියා කරමින් සිටිති. තවද අලි මිනිස් ගැටුම අවම කිරීම උදෙසා වනජීවී දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් කටයුතු කරනු ලබන අතර, එහිදී දිවයින පුරා ස්ථාපිත විදුලි වැටවල් 318ක (කි.මී 4429) නඩත්තු කටයුතු සඳහාත්, වන අලි පලවා හැරීමේ රාජකාරී සඳහාත්, වනජීවී කාර්යාල වෙත සිවිල් ආරක්ෂක සාමාජිකයින් 4381 දෙනෙකු යොදවා ඇත.

එමෙන්ම දැනට දීඝවාපිය චෛත්‍ය, නීලගිරිය චෛත්‍ය ඇතුළු පුරාණ බෞද්ධ සිද්ධස්ථාන නැවත වරක් ලෝකවාසී බෞද්ධ බැතිමතුන්ට වන්දනාමාන කිරීම උදෙසා ප්‍රතිසංස්කරණය කිරීම මෙන්ම දිවයින පුරා විසිරුණු ආගමික සිද්ධස්ථාන නඟා සිටුවීමේ කාර්යය සඳහාත්, විවිධ බාහිර පාර්ශවයන් වෙතින් එල්ලවන බලපෑම්වලින් බෞද්ධ මධ්‍යස්ථාන මෙන්ම පුරාවිද්‍යා වටිනාකමක් ඇති ආගමික ස්ථාන ආරක්ෂා කිරීමේ කාර්යය සඳහාත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින් තම දායකත්වය ලබාදෙමින් සිටිති. විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනවල ආරක්ෂක රාජකාරීන් ද ශ්‍රී ලංකා පොලිසිය සමඟ එක්ව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් වෙමින් ද, රටට අත්‍යාවශ්‍ය වූ සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් ඉතාමත් කාර්යක්ෂම මෙන්ම ඉහළ ගුණාත්මක භාවයකින් යුක්තව සාපේක්ෂව අඩු පිරිවැයකින් ඉටු කිරීමේ කාර්යයට ද වර්තමානයේ මෙම දෙපාර්තමේන්තු සාමාජිකයන් දායකත්වය ලබා දී ඇත.

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදෙස් මත ගරු රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන් හා ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මැතිතුමාගේ මාර්ගෝපදේශයෙන් රටේ කෘෂි කර්මාන්තය මෙන්ම අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා මෙම දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන්ගේ සේවය ලබාදෙන අතර, පසුගිය වසර තුළ දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ඉලක්ක හා අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට හැකියාව ලැබී ඇත. එහිදී මෙම දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තු ගත කළ ආදායම රුපියල් මිලියන 925 වුවද, රුපියල් මිලියන 1939.1 ක සම්පූර්ණ ආදායමක් උපයා ගැනීමටත්, ඉන් රජයේ ආදායමට රුපියල් මිලියන 1545 ක මුදලක් බැරකිරීමටත් කටයුතු කර ඇති බැව් වාර්තා අනුව පෙන්වා දීමට කැමැත්තෙමි.

මෙවන් විශාල සේවයක් රට වෙනුවෙන් සපයන්නා වූ සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ වෘත්තීය දැනුම නංවාලීම සඳහා සුවිශේෂී ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ක්‍රියාවට නංවා ඇති අතර, ඔවුන්ගේ ආකල්ප, කුසලතා මෙන්ම ඔවුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීම උදෙසා විශේෂ ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අතර දිස්ත්‍රික් නිලධාරී පුහුණු පාඨමාලා, ජ්‍යෙෂ්ඨ නියාමකයින් සඳහා නායකත්ව පුහුණු පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කරමින් ඔවුන්ගේ රාජකාරී කටයුතු මනාව ඉටුකිරීමට අවශ්‍ය දැනුම ලබාදීම මඟින් ඔවුන්ගේ දායකත්වය තවදුරටත් ඉහළ ඵලදායීතාවයකින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

පසුගිය වසරවල මෙන්ම 2023 වර්ෂයේත් නිවාස නොමැති සිවිල් ආරක්ෂක සාමාජිකයින් හට නිවාස ලබාදීම ද, නිවාසවල වැඩ අවසන් කිරීමට නොහැකිවූවන් හට ඒවායේ වැඩ අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ද තම දුවා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොත්පත් ආදිය නොමිලේ ලබාදීම ද මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සිදුකරමින් පවතී. එමඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ සාමාජීය තත්ත්වයන් ඉහළ නැංවීම මූලික පරමාර්ථය වී ඇත.

එසේම දිවයින පුරා ග්‍රාමීය මට්ටමින් ඩෙංගු උවදුර මැඩපැවැත්වීම උදෙසා ශ්‍රමදාන කාර්යයන් හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ සම්බන්ධතාවයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීමත්, මතින් තොර දේශයක් බිහිකරලීමේ කාර්යය වෙනුවෙන් පුහුණුවලත් උපදේශකයින් මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමත්, ලේ දන් දීමේ වැඩසටහන් සඳහා දායකත්ව සැපයීමත්, ජීවිතාරක්ෂක කණ්ඩායම් මඟින් දෙස් විදෙස් ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමේ කාර්යයන් ඉටුකිරීමත් වැනි සමාජ සුබ සාධන කාර්යයන්හී නිරත වීම හා ඒ පිළිබඳ දෙපාර්තමේන්තු සාමාජිකයින් ඇගයීමට ලක්වීම ඉතා ප්‍රශංසනීය වනු ඇත.

මාතෘ භූමියේ තිරසර සංවර්ධනය නංවාලීම සඳහා මෙන්ම නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය සහය උපරිම ලෙස ලබා දීමටත්, මෙම වසරේදී **"සියවසට පියවරක්"** යන තේමාව යටතේ 2023 - 2048 ඉදිරි විසිපස් වසර සඳහා වන ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රවේශයට අනුගත වෙමින් අප වෙත පැවරෙන සියළුම වගකීම් කැපවීමෙන් මෙන්ම හැකි උපරිම අයුරින් ඉටු කිරීමටත් අප මාතෘභූමිය ගොඩනැංවීමේ කාර්යය උදෙසා ලබාදිය හැකි උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කරන අතරම එම කාර්යයන් උසස් ඵලදායීතාවයකින් ලබාදීම උදෙසා නිලධාරීන් ඇතුළු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන් හටත්, සිවිල් කාර්යය මණ්ඩලයටත් අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබෙවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

එයාර් වයිස් මාර්ෂල් ආර්එස් බියන්විල (විශ්‍රාමික)
විඑස්වී යූඑස්පී එම්බීඑ(එක්සත් රාජධානිය) එන්ඩීසී(ඉන්දියා) පීඑස්සී
අධ්‍යක්ෂ ජනරාල්

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	එයාර් වයිෂ් මාර්ෂල්	ආර්එස් බියන්විල (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී එම්බීඒ(එක්සත් රාජධානිය) එන්ඩීසී(ඉන්දියාව) පීඑස්සී	අධ්‍යක්ෂ ජනරාල්
2	ස්කෝඩ්‍රන් ලීඩර්	කේඑච්ඒඑස්අයි සඳරුවන්	අධ්‍යක්ෂ ජනරාල් සහකාර ලේකම්
3	ස්කෝඩ්‍රන් ලීඩර්	ආර්එම්ඒඑස් බංඩාර	අධ්‍යක්ෂ ජනරාල් අධිසහායක

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	බ්‍රිගේඩියර්	ඩබ්එම්එස්එන් ඇරැගොඩ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අධ්‍යක්ෂ පාලන
2	බ්‍රිගේඩියර්	එම්ඩීබීඑම්එස් ජයමාන්න (විශ්‍රා)	අධ්‍යක්ෂ ව්‍යාපෘති හා මාධ්‍යය
3	බ්‍රිගේඩියර්	අයිඩීඩී ප්‍රනාන්දු	අධ්‍යක්ෂ පිරිස් පාලන
4	කර්නල්	ඩීඅයිඒ පෙරේරා ආර්එස්පී යූඑස්පී	අධ්‍යක්ෂ මෙහෙයුම්
5	කර්නල්	එච්ඒඩීඑම් සරත්චන්ද්‍ර	අධ්‍යක්ෂ පුහුණු / සේවාවනිතා සම්බන්ධීකරණ
6	කර්නල්	එල්ජීකේ කිත්සිරි	අණදෙන නිලධාරි - මුලතිව්
7	ලුතිනන් කර්නල්	ඩීජේඑස්එල් පොන්වීර	අණදෙන නිලධාරි - පොලොන්නරුව
8	ලුතිනන් කර්නල්	ඩීඑම්එම් සුභසිංහ	මූලස්ථාන අණදෙන නිලධාරි
9	ලුතිනන් කර්නල්	යූජීර්කේඑන්අයි උඩදිවෙල ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - මොණරාගල
10	ලුතිනන් කර්නල්	එල්ආර්එම්යූබී රත්නායක ආර්එස්පී	අණදෙන නිලධාරි - සේරුපිට
11	ලුතිනන් කර්නල්	යූඑච්ටීඑන් පෙරේරා	මාණ්ඩලික නිලධාරි ව්‍යාපෘති (සේවා වනිතා)
12	ලුතිතන් කර්නල්	ඩබ්එම්ජී විජේතුංග යූඑස්පී	අණදෙන නිලධාරි - වැලිඔය
13	ලුතිතන් කර්නල්	යූජීඑස්කේඑස්සී සෝමපාල යූඑස්පී අයිඑස්සී	අණදෙන නිලධාරි - විශ්වමඩු
14	ලුතිතන් කර්නල්	ඩීඑම්එල්ටී දිසානායක යූඑස්පී පීඑස්සී අයිජී	අණදෙන නිලධාරි - අනුරාධපුර
15	ලුතිනන් කර්නල්	එච්බීඑම්බීඑන් බංඩාර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - හොරොව්පොතාන
16	ලුතිනන් කර්නල්	ආර්එම්සී කමලසිරි යූඑස්පී	අණදෙන නිලධාරි - වෙන්නවත්ත
17	ලුතිනන් කර්නල්	ඩබ්ඒපී ගුණතිලක ආර්එස්පී පීඑස්සී අයිජී එල්එස්සී	අණදෙන නිලධාරි - මහඔය
18	ලුතිනන් කර්නල්	ජීආර්එච් වර්ණසිත් ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරි - වව්නියාව
19	ලුතිනන් කර්නල්	ඩබ්ඊඑම්සී ඒකනායක යූඑස්පී පීඑස්සී	අණදෙන නිලධාරි - කටුනායක
20	ලුතිනන් කර්නල්	එස්ඩීඩී රසික කුමාර	අණදෙන නිලධාරි - විල්පත්තු
21	ලුතිනන් කර්නල්	ඊආර්කේ එදිරිමුණි ආර්ඩබ්පී	අණදෙන නිලධාරි - අම්පාර
22	ලුතිනන් කර්නල්	ඒඅයි හෙට්ටිආරච්චි	නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රවාහන
23	ලුතිනන් කර්නල්	එම්ඒසී ගුණරත්න කේඑස්පී	නියෝජ්‍ය අධ්‍යක්ෂ පිරිස් පාලන

24	ලුතිනන් කර්නල්	ජේඑම්ඩබ්ලිව් බංඩාර ආර්එස්පී පීඑස්සී	අණදෙන නිලධාරි - පුත්තලම
25	ලුතිනන් කර්නල්	ජීඅයිඩබ්ලිව් ගීකියනගේ	අණදෙන නිලධාරි - කිලිනොච්චි
26	ලුතිනන් කර්නල්	එච්ටීපී කුමාරසිරි	වනජීවී සම්බන්ධීකරණ නිලධාරි
27	ලුතිනන් කර්නල්	බීඑච්ඩී පද්මකුමාර	අණදෙන නිලධාරි - කල්පිටිය පුහුණු පාසල
28	ලුතිනන් කර්නල්	ඩබ්එම්ජීජේ වනිගසේකර	අධ්‍යක්ෂ සුබසාධක
29	ලුතිනන් කර්නල්	යූඑල්සී ජයසේන	අණදෙන නිලධාරි - පහලලන්ද පුහුණු පාසල
30	ලුතිනන් කර්නල්	ඩීඑස්පී විජේසිංහ	අණදෙන නිලධාරි - ගෝමරන්කඩවල
31	ලුතිනන් කර්නල්	ඩබ්ඒඑල්ඒ කුමාර	අණදෙන නිලධාරි - සේරුවිල
32	ලුතිනන් කර්නල්	එච්එම්එස්ඩීකේ හේරත්	අණදෙන නිලධාරි - මහනුවර
33	ලුතිනන් කර්නල්	ඩීඑල්වයිඒ ලක්පුර	අණදෙන නිලධාරි - උහන
34	ලුතිනන් කර්නල්	එස්වයි ශ්‍රීමාල්	අණදෙන නිලධාරි - කතරගම
35	ලුතිනන් කර්නල්	ආර්පීකේජී රණසිංහ	අණදෙන නිලධාරි - විල්පත්තු
36	ලුතිනන් කර්නල්	ඒයූ ප්‍රියන්ත ආර්එස්පී	අණදෙන නිලධාරි - කැබිතිගොල්ලෑව
37	ලුතිනන් කර්නල්	එච්යූපීකේ සිල්වා	අණදෙන නිලධාරි - ගල්කිරියාගම
38	මේජර්	ඒ වර්ණකුලසූරිය	මාණ්ඩලික නිලධාරි (ඉදිකිරීම් හා නඩත්තු)
39	මේජර්	ඩබ්ආර් ප්‍රසන්න	මාණ්ඩලික නිලධාරි(ප්‍රසම්පාදන/ක්‍රීඩා)
40	මේජර්	ආර්එස්එම් විජේසිංහ	මාණ්ඩලික නිලධාරි - විශ්‍රාම වැටුප්
41	මේජර්	එච්එම්ආර්පී කුමාර	දෙවන අණදෙන නිලධාරි - කතරගම
42	මේජර්	එස්සී ද සිල්වා ආර්ඩබ්ලිපී ආර්එස්පී	අණදෙන නිලධාරි - කල්පිටිය පුහුණු පාසල
43	මේජර්	කේසී අකලංක ආර්එස්පී	අණදෙන නිලධාරි - ත්‍රිකුණාමලය
44	මේජර්	එච්විසීජේ හපුආරච්චි ආර්ඩබ්ලිපී යූඑස්පී	අණදෙන නිලධාරි - පහලලන්ද පුහුණු පාසල
45	මේජර්	එම්ඒඩී කුමාර	අණදෙන නිලධාරි - මැදිරිගිරිය
46	මේජර්	පීජීටී ජයසිංහ	නීති නිලධාරි
47	මේජර්	කේජේආර්එස් පෙරේරා	දෙවන අණදෙන නිලධාරි
48	මේජර්	එච්කේඑස් ප්‍රදීප්	දෙවන අණදෙන නිලධාරි - අම්පාර
49	මේජර්	ජේපී විජේතුංග	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (ව්‍යාපෘති)
50	මේජර්	එච්එම්එන්එන් ප්‍රේමජයන්ත	මාණ්ඩලික නිලධාරි(ආරක්ෂක සේවා සම්බන්ධීකරණ නිලධාරි)
51	මේජර්	ආර්ඩීආර්එම් ජයලත්	නඩත්තු හා ප්‍රවාහන නිලධාරී
52	කපිතාන්	ටීඩබ්එම්කේ අබේසිංහ ආර්ඩබ්ලිපී	වැලිසර උප බලකාය
53	කපිතාන්	යූකේආර්සී උඩවත්ත	පල්ලසේන ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරි

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	රියර් අද්මිරාල්	ඩබ්ඩීඊඑම් සුදර්ශන (විශ්‍රාමික) ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2	කොමදෝරු	ජේඒකේඑස් ජයකොඩි බීඒ(ඩීඑස්) එල්එල්එම්ඕ	අධ්‍යක්ෂ ප්‍රසම්පාදන
3	කපිතාන්	ආර්පීඑස් රණසිංහ	අණදෙන නිලධාරි - කටුනායක
4	කපිතාන්	එන්සිපීඑන් නානායක්කාර	ස්ථානභාර නිලධාරි - විශේෂ විමර්ෂන ඒකකය
5	කොමාණ්ඩර්	ආර්ජේඩී රණවීර	මාණ්ඩලික නිලධාරි - ප්‍රවාහන (නඩත්තු)
6	කොමාණ්ඩර්	ඩබ්ටී විජේරත්න	අණදෙන නිලධාරි - කොණ්ඩව්ව්

7	ලුතිනන් කොමාණ්ඩර්	එම්ජේපීටී සංජීව පතිරණ	ව්‍යාපාතිහාර නිලධාරී - විහාරමහාදේවී උද්‍යානය
8	ලුතිනන් කොමාණ්ඩර්	ඒඑම්සීආර් කුමාර	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී - මණ්ඩල අධ්‍යනය හා විමර්ෂන
9	ලුතිනන් කොමාණ්ඩර්	එස්එම්ඒ ශාන්ත	දෙවන අණදෙන නිලධාරී - මහඔය
10	ලුතිනන් කොමාණ්ඩර්	එන්එස් කුමාරජෝති	නියෝජ්‍ය අධ්‍යක්ෂ තාක්ෂණ
11	ලුතිනන් කොමාණ්ඩර්	ඩීඒඑස් සඳරුවන්	මාණ්ඩලික නිලධාරී - ප්‍රසම්පාදන

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	ප්‍රපොප	යූ අරුලානන්දම්	ස්ථානාධිපති -පොලිස් අංශය
2	පොප	ජේඑල්පී ප්‍රියදර්ශන	දෙවන අණදෙන නිලධාරී - මහනුවර
3	පොප	එස්එස් සමන්ත	ස්ථානාධිපති - ලාහුගල උප බලකාය
4	පොප	එම්ඒපීආර්කේ මුණසිංහ	දෙවන අණදෙන නිලධාරී - සේරුවිල
5	පොප	ඩීඑච්එල්ඩබ් ජයසිංහ	ස්ථානාධිපති - මිහින්තලය උප බලකාය
6	පොප	එච්ආර්ආර්පී ගුණරත්න	දෙවන අණදෙන නිලධාරී - පොලොන්නරුව
7	උපොප	වයිබීඑන් බන්දුල	දෙවන අණදෙන නිලධාරී - හොරොව්පොතාන
8	උපොප	එච්එම්එල්ටී හේරත්	දෙවන අණදෙන නිලධාරී - සේරුපිට පුහුණු පාසල
9	උපොප	පීකේ ජයතුංග	දෙවන අණදෙන නිලධාරී - ගෝමරන්කඩවල
10	උපොප	බීජීඒටී බංඩාර	මාණ්ඩලික නිලධාරී - වැලිසර ගබඩාව
11	උපොප	එස්එස් තිලකරත්න	මාණ්ඩලික නිලධාරී - මූලස්ථාන බලඇණිය
12	උපොප	ඩබ්එම්ආර්කේ වික්‍රමසිංහ	දෙවන අණදෙන නිලධාරී - පහලලන්ද
13	උපොප	ජේ විජේවර්ධන	දෙවන අණදෙන නිලධාරී - අනුරාධපුර
14	උපොප	ඩබ්එම්ඩබ් කුලතිලක	මාණ්ඩලික නිලධාරී - විහාරමහාදේවී උද්‍යානය
15	උපොප	විටිජීඩිටිසී ප්‍රියදර්ශන	දෙවන අණදෙන නිලධාරී - කටුනායක
16	උපොප	බීජී ගාමිණී	අතිරේක නිලධාරී - මැදිරිගිරිය
17	උපොප	එච්ඩී චන්ද්‍රසිරි	අතිරේක නිලධාරී - වැලිසර
18	උපොප	ආර්ඩී ගුණරත්න	අතිරේක නිලධාරී - සේරුපිට
19	උපොප	ඒපීජේ පිටදෙණිය	දෙවන අණදෙන නිලධාරී - වැලිඔය

දීප ව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය

අ/අ	ස්ථීර සේවය	නිලධාරියාගේ නම	තනතුර
1	ශ්‍රීලංගසේ I	ආර්ආර් බුලත්සිංහල මහත්මිය	අධ්‍යක්ෂ මුදල්
2	ශ්‍රීලංගසේ II	ජේඒ ජෙරීඩ් මහතා	සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
3	ශ්‍රීලංගසේ III	වීආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)
4	ශ්‍රීලංපසේ III	ඩී.එන්.කේ. ජයනන්ද මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පාලන)

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 320

පටුන

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය 3
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය 3
ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය 4
ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය. 5
දීපව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය 5

1 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 8
1.1 හැඳින්වීම 8
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 8
1.2.1 දැක්ම 8
1.2.2 මෙහෙවර 8
1.3 ප්‍රධාන කාර්යයන් 8
1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්මේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති 9
1.4 සංවිධාන සටහන 10
1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ 12
1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 13
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 13

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම 14
2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය 14
2.1.1 එක් එක් බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු මඟින් 2023 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන 15
2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය 16
2.3 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය 17
2.4 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘති ය 17
2.5 ඉදි කිරීම් කටයුතු සඳහා දායකත්වය 18
2.6 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු 18
2.7 ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම 19
2.8 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් ක්‍රියාවට නංවා ඇති කෘෂි ව්‍යාපෘති 19

2.9	ඩෙංගු මර්දන වැඩසටහන් පැවැත්වීම	21
2.10	මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	21
2.11	දෙපාර්තමේන්තු සුභසාධන ක්‍රියාකාරකම්	22
2.12	නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි	22
2.13	බලකා මඟින් ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති	23
3	**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	24
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	24
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	26
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	27
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	29
3.4.1	වාර්තා කිරීමේ පදනම	29
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	30
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	30
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	30
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	31
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	32
4	**කාර්යසාධන දර්ශක**	47
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	47
5	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	48
5.1	හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු	48
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	51
5.2.1	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ	51
5.2.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග	51
6	**මානව සම්පත් පැතිකඩ**	52
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	52
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය	53
6.3	මානව සම්පත් සංවර්ධනය	54
7	**අනුකූලතා වාර්තාව**	56

1 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1985 අංක 40 දරන මිනිස් බල උපයෝගීතා සහ පරිපූරක හමුදා පනතේ 52 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර හා උපකාරීවීමේ කාර්යය සඳහා පිහිටුවන ලද ග්‍රාමාරක්ෂක හමුදාව, 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (අමප/06/135/206/052) අනුව "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව" නමින් නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23ක් සහ පුහුණු පාසල් 04ක් ස්ථාපිත කර ඇති අතර 33,250කට ආසන්න ශ්‍රම බලකායක් සේවයේ යෙදී සිටී.

2015 ජූනි මස 12 වැනි සිකුරාදා දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ පැවති දිස්ත්‍රික් නිලධාරී, පාලක/නියාමක, උප පාලක/උප නියාමක, ග්‍රාම ආරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කර ඇත. තවද 2015 මාර්තු මස 05 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව සතු සුවිශාල 0මිනිස් බල සංචිතය ඵලදායී ලෙස යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල සංවර්ධන කටයුතු සිදු කිරීමේ හැකියාව සහ දෙපාර්තමේන්තුව ආදායම් උත්පාදනය කරන ආයතනයක් බවට පත්කිරීමේ හැකියාව සලකා දෙපාර්තමේන්තු කාර්යභාරය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

“ තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් ”

1.2.2 මෙහෙවර

“ශ්‍රී ලංකා මාතෘ භූමියේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට දිවි හිමියෙන් කැප වෙමින් ද, ජාතික සංවර්ධන හා ආර්ථික වර්ධන ඉලක්ක සාක්ෂාත් කරමින් ද, ‘පරිපූරක ශ්‍රම ආර්ථික බලකායක්’ ලෙස සෞභාග්‍යයේ දැක්මට විශිෂ්ට පෙර ගමන්කරුවකු වීම.”

1.3 ප්‍රධාන කාර්යයන්

1. රටතුළ උද්ගතවන ආරක්ෂක තත්ත්වයන් අනුව අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම.
2. ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
3. රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සන්නද්ධ හමුදාවන්ට සහ පොලිස් සේවාවට සහාය දීම.
4. ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවන්හිදී ඊට අදාළ ආරක්ෂාව සැලසීමේ කටයුතුවල යෙදීම.
5. රට තුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී (ගංවතුර, සුනාමි, නායයාම් වැනි) ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම.

6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම.

7. රාජ්‍ය ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගතව ආරක්ෂක සේවාවන් ලබාදීම.

8. දෙපාර්තමේන්තුව සතු සංස්කෘතික කණ්ඩායම්වල සේවය රාජ්‍ය ආයතනවල උත්සව අවස්ථාවන් සඳහා ලබාදීම.

9. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය එම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

10. දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම.

11. සමාජ සුබසාධන ක්‍රියාකාරකම්වලට සහාය වීම.

12. ජනාධිපතිතුමා, විෂයභාර අමාත්‍යතුමා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂිත කාර්යයන්වල යෙදීම.

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති

අංක 1462 / 20 හා 2006.09.13 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අ/ම/ප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් පවරන ලද ඉහත රාජකාරිවලට අමතරව රජය විසින් වරින් වර පහත සඳහන් රාජකාරි ද පවරා ඇත.


- දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු, පශු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මඟින් රටේ ජාතික ආහාර නිෂ්පාදනය ශක්තිමත් කිරීම.

- අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.

- ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම.


- උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.

1.4 සංවිධාන සටහන


සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
එකාබද්ධ සේවයේ නියෝජිත - 30, නියාමක (විශේෂ /1) - 3200, උප නියාමක - 6510, සිවිල් ආරක්ෂකභට - 39790, නියාමක (විශේෂ) නියෝජ - 30, නියාමක (I) - 70, , උප නියාමක නියෝජ - 90, සිවිල් ආරක්ෂක භට නියෝජ - 210,
සහනාරක්ෂක කමිකරු - 30

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු

බලකා/පුහුණු පාසල්/ව්‍යාපෘති කාර්යාල ස්ථානගත වීම



1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23ක් සහ පුහුණු පාසල් 04ක් ක්‍රියාත්මක වන අතර බලකා මූලස්ථාන/පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන් මඟින් එකිනෙක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්හි පරිපාලන කටයුතු සිදු වේ.

දෙපාර්තමේන්තුව සතු 33,250කට ආසන්න මානව සම්පත විවිධ ක්ෂේත්‍රගත ව්‍යාපෘති වෙත යොමු කරවීම දෙපාර්තමේන්තු මූලස්ථානයේ මෙහෙයවීමෙන් බලකා මූලස්ථාන/පුහුණු පාසල් මඟින් සිදු කෙරේ.

බලකා මූලස්ථාන - 24

1. මූලස්ථානය
2. වෙන්නවත්ත බලකා මූලස්ථානය
3. කටුනායක බලකා මූලස්ථානය
4. මහනුවර බලකා මූලස්ථානය
5. පුත්තලම බලකා මූලස්ථානය
6. අනුරාධපුර බලකා මූලස්ථානය
7. විල්පත්තුව බලකා මූලස්ථානය
8. වව්නියාව බලකා මූලස්ථානය
9. කිලිනොච්චි බලකා මූලස්ථානය
10. විශ්වමඩු බලකා මූලස්ථානය
11. මුලතිව් බලකා මූලස්ථානය
12. වැලිඔය බලකා මූලස්ථානය
13. කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය
14. හොරොව්පොතාන බලකා මූලස්ථානය
15. ගෝමරන්කඩවල බලකා මූලස්ථානය
16. ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය
17. සේරුවිල බලකා මූලස්ථානය
18. පොළොන්නරුව බලකා මූලස්ථානය
19. මැදිරිගිරිය බලකා මූලස්ථානය
20. මහඔය බලකා මූලස්ථානය
21. උහන බලකා මූලස්ථානය
22. අම්පාර බලකා මූලස්ථානය
23. මොණරාගල බලකා මූලස්ථානය
24. කතරගම බලකා මූලස්ථානය

පුහුණු පාසල් - 04

1. සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල
2. කල්පිටිය පුහුණු පාසල
3. ගල්කිරියාගම උසස් පුහුණු පාසල
4. පහළලන්ද පුහුණු පාසල

දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වලට අදාළ පාලන කටයුතු සිදු කරන අතර දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශ 23ක් යටතේ එම පාලන කාර්යන් විමධ්‍යගත කර ඇත.

i. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය
ii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
iii. අභ්‍යන්තර විගණන අංශය
iv. ආයතන අංශය
v. ගිණුම් අංශය
vi. වැටුප් අංශය
vii. මෙහෙයුම් අංශය
viii. පිරිස් පාලන අංශය
ix. ප්‍රසම්පාදන අංශය
x. ප්‍රවාහන අංශය
xi. පුහුණු අංශය
xii. ව්‍යාපෘති අංශය
xiii. සුබසාධක අංශය
xiv. තාක්ෂණ හා නඩත්තු අංශය
xv. පර්යේෂණ හා සංවර්ධන අංශය
xvi. මාධ්‍ය අංශය
xvii. ක්‍රීඩා අංශය
xviii. පෞද්ගලික ලිපි ගොනු අංශය
xix. විදුලි වැට සම්බන්ධීකරණ ඒකකය
xx. සේවා වනිතා ඒකකය
xxi. යහසාධක අරමුදල
xxii. සුවසවිය අරමුදල
xxiii. විශ්‍රාම වැටුප් අංශය

එක් එක් බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශයන්ට අදාළව 2023 වර්ෂය සඳහා සැලසුම්ගත කාර්යන්හි කාර්යසාධනය වෙන් වෙන්ව දක්වා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- සුවසවිය අරමුදල
- යහසාධක අරමුදල
- සුබසාධන අරමුදල
- ක්‍රීඩා අරමුදල
- ආගමික අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම -

ආ) දායක නියෝජිතායතනය -

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි -

ඈ) ව්‍යාපෘති කාල සීමාව -

} නැත

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යුධ විජයග්‍රහණයෙන් පසු නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය, සෞභාග්‍යයේ පෙර දැක්ම වැනි රජයේ ජාතික සංවර්ධන සංග්‍රාමයන්ට දායක විය. ඒ අනුව, රටේ ආහාර ඉල්ලුමට සරිලන වී, ධාන්‍ය, එළවලු වැනි මහා පරිමාණ කෘෂි, පශු ව්‍යාපෘතීන් ද, ගඩොල්, බ්ලොක් ගල් වැනි ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ව්‍යාපෘතීන් ද ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතීන් මේ වන විට වාර්ෂිකව ඉතා විශාල මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන දීර්ඝ කාලීන ආයෝජන ලෙස ක්‍රියාත්මක වන අතරම, රටේ ජාතික සංවර්ධනයට ද අඛණ්ඩ දායකත්වයක් දරනු ලබයි.

ඊට අමතරව මෙම දෙපාර්තමේන්තු භටයන් රාජ්‍ය ආයතන වලආරක්ෂක රාජකාරි, නර්තන හා සංගීත කණ්ඩායම් සේවා, ඉදිකිරීම්, නඩත්තු හා විවිධ සේවා සැපයීම තුළින් ද ආදායම් උත්පාදනය කිරීමට සමත් වී ඇත.

ඒ අනුව, උක්ත ආදායම් ලෙස, 2023 වර්ෂය තුළ පමණක් රුපියල් 1,545,782,149.40 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

ව්‍යාපෘති කාණ්ඩය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි	රු. මි
ව්‍යාපෘති	295	631	541	375	382	482.5	379.2	655.3	907.8
ආරක්ෂක සේවා	25	204	312	491	606	375.7	320.5	741.7	528.9
නර්තන හා සංගීත	-	27	11	6	17	3	1.6	4.6	4.6
නඩත්තු සේවා	-	23	19	22	24	17.5	25.58	67.3	28.5
ඉදිකිරීම් සේවා	-	30	58	87	102	90.5	1.57	6.4	8.6
විවිධ	3	141	202	16	25	9	41.06	89.7	67.1
එකතුව	323	1,056	1,143	997	1,156	978.2	769.5	1565	1545.78




2.1.1 එක් එක් බලකා මූලස්ථාන , පුහුණු කඳවුරු මඟින් 2023 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන

2023 වර්ෂයට අදාළව ඉහත 2.1. වගුව මඟින් කෘෂි, පශු, ගඩොල් යන කාණ්ඩ යටතේ පොදුවේ දක්වා ඇති ආදායම ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වෙන් වෙන් වශයෙන් ඒ ඒ ආයතනයන්හි ප්‍රගතිය ලෙස පහත දක්වා ඇත. තවද, පහත දක්වා ඇති ආදායම් හා ව්‍යාපෘති ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වැඩිදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2023 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
අම්පාර	113,140,647.76
අනුරාධපුර	16,262,236.70
ගෝමරන්කඩවල	48,173,366.80
හොරොව්පතාන	42,799,134.50
කැබතිගොල්ලෑව	47,768,276.45
මහනුවර	544,970.00
කන්තලේ	51,820,467.08
කතරගම	2,631,181.20
කටුනායක	-
කිළිනොච්චිය	34,233,911.34
කුරගල	-
මැදිරිගිරිය	7,507,615.56
මහඔය	36,442,463.37
මොණරාගල	69,601,620.56
මුලතිව්	24,760,000.17
පොළොන්නරුව	69,901,879.29

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2023 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
පුත්තලම	27,049,603.65
සේරුවිල	80,169,113.75
උහන	61,451,641.55
විල්පත්තුව	33,622,063.80
වවුනියාව	37,199,115.43
වැලිඔය	58,186,751.12
වෙන්නවත්ත	831,380.00
කොණ්ඩච්චි	14,692,360.00
ගල්කිරියාගම	581,752.50
විශ්වමඩු	28,367,137.80
මිහින්තලය	-
කල්පිටිය	721,095.00
මූලස්ථානය/සේරුපිට	3,589,303.75
පහළලන්ද	451,780.00
එකතුව	**912,500,869.13**



2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය

යුධ විජයග්‍රහණයෙන් අනතුරුව රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවාවට සහාය වීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වේ. ඒ අනුව 2023 වර්ෂය තුළ දිවයින පුරා පොලිස් ස්ථාන 313 ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 2043 ක් අනුයුක්ත කර ඇත. මෙම කාර්යන් ඉදිරි වර්ෂයන්හී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඊට අමතරව පහත පරිදි දෙපාර්තමේන්තු මානව සම්පත විවිධ කාර්යයන්හි යොදවා ඇත.

කාර්යය	හට සංඛ්‍යාව
පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා	322
රාජ්‍ය ආයතන සඳහා ආරක්ෂාව සැපයීම	1841
විදුලි වැට නඩත්තු හා කාර්යාල කටයුතු සඳහා	3565
වන අලි කළමනාකරණය හා වන අලි පලවා හැරීම	816
නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි	263
ඉදිකිරීම් රාජකාරි	31
ආගමික ස්ථාන සඳහා	2845









2.3 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති හා සේනාධිනායක අතිගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ගාලු මුවදොර පිටියේදී පෙබරවාරි 04 වන දින පෙරවරුවේ පැවති 75 වන නිදහස් දින සැමරුම් පෙළපාලිය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මහත් අභිමානයෙන් සහභාගී විය.

නිදහස් සැමරුම් උළලේ ආචාර පෙළපාලිය සඳහා නිලධාරීන් 14 දෙනෙකුගෙන් සහ සිවිල් ආරක්ෂක භටයින් 361 දෙනෙකුගෙන් සමන්විතව අංශ දෙකක් සමඟ තූර්ය වාදක කණ්ඩායම සහ සංස්කෘතික කණ්ඩායමද සහභාගී විය.







2.4 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය

2013.04.26 වන දින එවක ආරක්ෂක ලේකම් හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් කුරගල සංචාරයේදී අන්‍යාගමික ග්‍රහණයට නතුවී තිබූ කුරගල පුරාවිද්‍යා ස්මාරක සහිත පූජණීය ස්ථාන මුල්කොට ගෙන එම ගමෙහි පදිංචි තරුණ පිරිස් 54 දෙනෙකු බදවාගෙන කුරගල පුජා භූමි සංරක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත. පසුව එම කටයුතු අවසන් වූ පසු මෙම ස්ථානය වෙන්නවත්ත බලකා මූලස්ථානයට අනුබද්ධ ව්‍යාපෘති කාර්යාලයක් බවට පත්කර ඉන් අනතුරුව කතරගම බලකායට අනුයුක්තව මෙම ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යන අතර මේ වන විට 200 කින් යුත් භට පිරිසක් සමඟ කුරගල ව්‍යාපෘති කාර්යාලය නමින් වගා ව්‍යාපෘති , රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි, ආදීයෙහි භටපිරිස් යොදවා කුරගල ව්‍යාපෘති කාර්යාලයක් ලෙස පවත්වාගෙන යනු ලබයි.





2.5 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පෙදරේරු, වඩු, විදුලි කාර්මික, ජලනල කාර්මික වැනි ක්ෂේත්‍රයන්ගේ පුහුණු සිවිල් ආරක්ෂක ශ්‍රමිකයන්ගේ සේවය රාජ්‍ය අංශයේ විවිධ ආයතන වෙත හා ආගමික සිද්ධස්ථාන වෙත ලබා දෙනු ලබයි.

ඒ යටතේ 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

අනු අංකය	ඉදිකිරීම් ව්‍යාපෘතියේ විස්තර	යොදවා ඇති හටයින් ගණන
1	පල්ලන්සේන බන්ධනාගාරයේ දෙමහල් ගොඩනැඟිලි 04 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	23
2	අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෝහල නවීකරණය කිරීමේ සේවාව	18





2.6 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිසුන්ගේ හා අලි ඇතුන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කළමනාකරණ හා පලවා හැරීම්, අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක හටයන් 4381 ක් යොදවා 4429.545 Km ක දිගින් යුක්ත වන විදුලි වැටවල් 318 ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.





2.7 ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ස්වේච්ඡා ගුරුවරුන් අනුයුක්ත කිරීම හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම

දිවයිනේ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි ගුරුවරුන් හිඟ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරනු වස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සුදුසුකම් ලත් ගුරුවරුන් 180 ක් උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත් වල පාසල් 142 ක් වෙත අනුයුක්ත කර ඇත.






2.8 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන වෙතින් ක්‍රියාවට නංවා ඇති කෘෂි ව්‍යාපෘති

කතරගම බලකා මූලස්ථානය

- දඹේ කෘෂි ව්‍යාපෘතිය - යල කන්නයේ අක්කර 2ක වී වගාව ආරම්භ කිරීම හා අක්කර භාගයක පමණ භූමි භාගයක හරිත මිරිස් වගාවක් ආරම්භ කර පවත්වා ගෙන යාම.





- **තංගල්ල නෙටොල්පිටිය කෘෂි ව්‍යාපෘතිය - නෙටොල්පිටිය කොක්වත්ත ප්‍රදේශයේ පිහිටි අක්කර 08ක භූමි ප්‍රමාණයෙන් අක්කර දෙකක භූමි ප්‍රමාණයෙන් කහ වගාවත්, අක්කර 2 ½ ක බටු වගාවත්, අක්කර 2 ½ක මඤ්ඤොක්කා වගාවත් සිදුකරන ලදී.**

- **කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර අලෙවි කිරීම.**

සේරුවිල බලකා මූලස්ථානය

➢ ටොම් ඊ ජේ සී අඹ ව්‍යාපෘතිය - අක්කර 4 $^{1}/_{2}$ ක පමණ භූමි ප්‍රමාණයක අඹ පැළ 800ක් වගා කර ඇති අතර, සාර්ථකව එම වගාව පවත්වා ගෙන යාමට කටයුතු කරයි.




අම්පාර බලකා මූලස්ථානය

➢ උක් වගා ව්‍යාපෘතිය




➢ කජු වගා ව්‍යාපෘතිය




2.9 ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම

2023 වර්ෂයේ ප්‍රදේශය තුළ ඩෙංගු මදුරුවන් බෝවීම විශාල වශයෙන් පැතිරීම හේතුවෙන් පොදු ස්ථාන හා ඩෙංගු බෝවීමේ ස්ථාන හඳුනාගෙන ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සහයෝගයෙන් විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව, රට පුරා විවිධ ප්‍රදේශයන්හි විවිධ ආයතන විසින් පවත්වන ලද ඩෙංගු මර්ධන වැඩසටහන් 123 ක් සඳහා සාමාජික/සාමාජිකාවන් 1229 ක් යොදවා ඇත.







2.10 මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රට තුළ තරුණ තරුණියන් හා ළමා පරපුර මත්ද්‍රව්‍ය භාවිතයට විශාල වශයෙන් නැඹුරුවීම හේතුවෙන් එය අවම කර ගැනීම හා මතින් නිදහස් කර ගැනීමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව විශේෂ පුහුණුව ලත් උපදේශකයින් යොදවා උපදේශන වැඩසටහන් 30ක් පමණ ක්‍රියාත්මක කර ඇත.





2.11 දෙපාර්තමේන්තු සුභසාධන ක්‍රියාකාරකම්

විශ්වමඩු,කිළිනොච්චි,මුලතිව් යන ප්‍රදේශවල සිවිල් ආරක්ෂක සාමාජික පවුල්වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම සහ විල්පත්තුව මියගිය රණවිරු පවුල් සඳහා වියලි ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහන





විශ්වමඩු, කිළිනොච්චි, මුලතිව් යන ප්‍රදේශවල තෝරාගත් සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ පවුල් සඳහා නිවාස ලබාදීමේ වැඩසටහන



2.12 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි

විහාර මහා දේවී උද්‍යානය, කාක දූපත වෙරළ උද්‍යානය, කොළඹ පාවෙන වෙළඳ සංකීරණය, මාදිවෙල ඇවිදින මංතිරුව ආදී ස්ථාන රාශියක නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි සඳහා භටයන් 263 දෙනෙකු වර්ෂය පුරා රාජකාරියෙහි අනුයුක්ත කර ඇත.





2.13 බලකා මඟින් ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති

- රෝහල් අළුත්වැඩියාව වෙනුවෙන් ශ්‍රමදායකත්වය ලබාදීම.
- වෙහෙර විහාරස්ථාන ඉදිකිරීමට අවශ්‍ය ශ්‍රමදායකත්වය සැපයීම.
- මැටි භාණ්ඩ ව්‍යාපෘති/ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘති/ සත්ත්ව ව්‍යාපෘති/ ඉඳල් නිෂ්පාදන ව්‍යාපෘති ආදිය සිදුකිරීම.
- සැලුන් ව්‍යාපෘති පවත්වා ගෙන යාම.

වෙහෙර විහාරස්ථාන ඉදිකිරීම්







සැලුන් ව්‍යාපෘතිය - අම්පාර නගරයේ පවත්වා ගෙන යන අතර, ඒ සඳහා හටයින් 09 දෙනෙක යොදවා ඇත.



ගඩොල් ව්‍යාපෘති



3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ - එෆ්

2023.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය **රු.**

අයවැය වර්තමාන වර්ෂය (2023)		සටහන	තත්‍ය රු.		
			වර්තමාන වර්ෂය 2023	ඉකුත් වර්ෂය නැවත ගළපන 2022	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ - 1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		17,180,150,000	17,534,496,000	ඒසිඒ - 3
-	තැන්පතු		1,106,675,531	1,164,671,237	ඒසිඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		366,048,253	362,403,224	ඒසිඒ - 5/5(අ)
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**18,652,873,784**	**19,061,570,461**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**18,652,873,784**	**19,061,570,461**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		459,934,655	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**18,192,939,129**	**19,061,570,461**	
	අඩු කළා: වියදම		-	-	
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසිඒ -2(II)
17,822,273,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	17,792,785,871	18,289,562,501	
757,127,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	558,331,609	825,136,675	
111,200,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	44,119,205	36,505,437	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
18,690,600,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**18,395,236,685**	**19,151,204,613**	

	මූලධන වියදම්				
54,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	33,383,572	32,505,028	
6,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	5,577,946	11,506,192	
-	ප්‍රාග්ධන පැවරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	**ඒසීඒ - 2(II)**
3,000,000	හැකියා වර්ධනය	14	2,997,515	2,168,408	
322,300,000	වෙනත් මූලධන වියදම්	15	178,179,462	134,854,433	
386,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**220,138,495**	**181,034,062**	
	තැන්පතු ගෙවීම්		-	1,373,769,684	**ඒසීඒ - 4**
	අත්තිකාරම් ගෙවීම්		1,251,672,285	335,524,124	**ඒසීඒ - 5/5(අ)**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		285,305,473	1,709,293,808	
19,077,100,000.00	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**20,152,352,938**	21,041,532,483	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(1,959,413,808)**	**(1,979,962,023)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ -පි

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

			තත්‍ය
	සටහන	වර්තමාන වර්ෂය **2023**	ඉකුත් වර්ෂය **2022**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසිඒ -6**	1,761,457,769	2,314,614,772
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	**ඒසිඒ -5/5(අ)**	622,746,859	703,489,640
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසිඒ -3**	-	-
මුළු වත්කම්		**2,384,204,629**	**3,018,104,412**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		537,762,676	473,508,701
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		1,761,457,769	2,314,614,772
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ -5(ආ)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	**ඒසිඒ -4**	84,984,184	229,980,938
අග්‍රිම ශේෂය	**ඒසිඒ -3**	-	-
මුළු වගකීම්		**2,384,204,629**	**3,018,104,412**

පිටු අංක 23 සිට 25 දක්වෙන ඉහත ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 26 සිට 28 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	**ගණන් දීමේ නිලධාරී**	**ප්‍රධාන ගණකාධිකාරී**
ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී ගුවස්පී එන්ඩීසී පීඑස්සී එම්ඉල් ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය	එයාර් වයිස් මාර්ෂල් ආර්එස් බියන්විල(විශ්‍රාමික) වීඑස්වී යුවස්පී එම්බීඒ (එක්සත් රාජධානිය) එන්ඩීසී (ඉන්දියා) පීඑස්සී අධ්‍යක්ෂ ජනරාල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	ආර්.ආර්. බුලත්සිංහල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
දිනය : 2024.05. 29	දිනය : 2024.05. 16	දිනය : 2024.05. 16

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය **2023**	ඉකුත් වර්ෂය නැවත ගලපන ලද **2022**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	රු.	රු.
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	2,293,347,741	2,343,545,361
අග්‍රිම ලැබීම්	17,180,150,000	17,534,496,000
අත්තිකාරම් අයකර ගැනීම්	362,847,395	360,988,811
තැන්පතු ලැබීම්	1,106,675,531	1,164,671,237
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**20,943,020,667**	21,403,701,409
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	18,239,775,853	19,023,974,256
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	44,119,205	36,505,437
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	441,861,867	454,296,847
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	459,934,655	-
අත්තිකාරම් ගෙවීම්	285,518,308	334,121,122
තැන්පතු ගෙවීම්	1,251,672,285	1,373,769,684
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**20,722,882,172**	21,222,667,346
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)	**220,138,495**	181,034,062
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම් අත්තිකාරම් අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-

<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	220,138,495	181,034,062
අත්තිකාරම් ගෙවීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**220,138,495**	181,034,062
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) - (ඉ)	**(220,138,495)**	(181,034,062)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	0.00	0.00
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0.00	0.00
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0.00	0.00

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4.1 වාර්තා කිරීමේ පදනම

1. **<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**
2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. **<u>මිනුම්කරණ පදනම</u>**
මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. **<u>ආදායම් හඳුනාගැනීම</u>**
හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. **<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**
වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**
මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**
2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7. **<u>දෙපාර්තමේන්තු පොත් තුළ හඳුනා නොගන්නා ලද මූල්‍ය නොවන වත්කම් (ජීව විද්‍යාත්මක වත්කම්) හෙළිදරව් කිරීම</u>**
ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවීම හේතුවෙන් 2023 මූල්‍ය ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනා නොගන්නා ලද ජීව විද්‍යාත්මක වත්කම් ඇමුණුම x යටතේ හෙලිදරව් කර ඇත.

8. **<u>දෙපාර්තමේන්තු පොත් තුල ගිණුම්ගත නොකරන ලද මූල්‍ය නොවන වත්කම් (වෙනත් යන්ත්‍ර හා උපකරණ) හෙළිදරව් කිරීම</u>**
දෙපාර්තමේන්තුව විසින් ස්ථානීය වශයෙන් හඳුනාගෙන තක්සේරු කලද, 2023 මූල්‍ය ප්‍රකාශය තුල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත නොකරන ලද වෙනත් යන්ත්‍ර හා උපකරණ ඇමුණුම xi යටතේ හෙලිදරව් කර ඇත.

9. **<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස් කරන ලද ආදායම</u>**
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අංක 05/2023 ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව, වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද ආදායම 2023.12.31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය(ACA-F) තුල සහ ACA - 1 ආකෘතිය තුල වාර්තා කර නොමැත. එම තොරතුරු ඇමුණුම xii යටතේ හෙලිදරව් කර ඇත.

10. **<u>2023.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව</u>**
රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ 03 ප්‍රකාරව 2023.12.31 දිනට පිළියෙළ කරන ලද හිඟ ආදායම් පිළිබඳ වාර්තාව ඇමුණුම xiii යටතේ අන්තර්ගතය.
* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.
* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොළිය			736,303.64	
20.03.99.00	විකුණුම් හා ගාස්තු			26,978,550.32	
20.04.01.00	නිවාස කුලී			1,547,881,232.84	
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	717,288,582.91	
20.06.02.01	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වාහන)	-	-	105,550.00	
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්)	-	-	357,521.50	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	19,540,600,000	18,690,600,000	18,395,236,685	98.42%
ප්‍රාග්ධන	372,500,000	386,500,000	220,138,495	56.96%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
01	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	වැටුප් හා දීමනා ගෙවීම		98,156,765	98,156,765	100%
		ආහාර සලාක වියදම් නිරවුල් කිරීම		4,773,812	4,773,812	100%
02	ශ්‍රී ලංකා ගුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් ගුම්රිය බලපත්‍ර වියදම්		8,411,050	8,411,050	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට හාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	607,417,452.64	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	746,034,616.62	593,630,100	-
9153	ඉඩම්	-	347,294,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	60,711,700.00	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

5/46 -(5)
216

මගේ අංකය / எனது இல. / My No. DEF/E/CSD/2023/FA

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 29 දින

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 784 29 MAY 2024 804

RECEIVED 31 MAY 2024 Internal Audit Division

ගණන්දීමේ නිලධාරී
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொலதுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.
වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොනිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1.1	දෙපාර්තමේන්තුවට වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම.	1.6.1(අ)
1.6.1.2	අදාළ හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම.	2.1
1.6.2.1 (අ)(ආ)(ඇ)	අදාළ වත්කම් ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම. ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව නඩත්තු කළ යුතු වීම. නිවැරදිව තක්සේරුකර ගිණුම්ගත කළ යුතු වීම.	1.6.2
2.1	අත්තිකාරම් ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වීම	1.6.3
2.2	කඩිනමින් බැරකම් බෙරුම් කිරීමට කටයුතු කළ යුතු වීම.	2.3(ආ)
2.3(ආ)	අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. (අග්‍රිම)	2.8
3.2.2	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	3.2
3.3 (ආ)	කඩිනමින් නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	3.3 (ඇ)
3.3 (ඇ)	නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	3.3 (ඇ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන ආදායම්වලින් දෙපාර්තමේන්තුව සෑම වර්ෂයකම සැලකිය යුතු ආදායමක් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂයේදී ද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 1,547.8 ක ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 ජූනි 12 දින රු.720,000 ක මුදලකට රතු කැකුළු සහල් කි.ග්‍රෑ. 4,500 ක් හා රු.480,000 ක මුදලකට සුදු කැකුළු සහල් කි.ග්‍රෑ. 3,000 ක් දියතලාව යුධ හමුදා පුහුණු පාසලට අලෙවි කිරීමෙන් උහන බලකාය වෙත රු. 1,200,000 ක මුදලක් සහ 2022 දෙසැම්බර්, 2023 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසවලදී මහඔය බලකා සාමාජිකයන් වෙත සුදු බෝල සහල් කි.ග්‍රෑ. 12,014 ක් අලෙවි කිරීම වෙනුවෙන් සේවා වනිතා ඒකකය මඟින් රු.1,063,047 ක මුදලක් මහඔය බලකාය වෙත ලැබීමට තිබූ අතර, එම ලැබිය යුතු මුළු මුදල වූ රු.2,263,047 ක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන වාර්තා කර නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොතිබූ අතර, ඒ අනුව හිඟ ආදායම් ප්‍රමාණ එම ප්‍රමාණවලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) වැලිසර බලකාය, 2021, 2022, 2023 යන වර්ෂයන්වලදී වී, ධාන්‍ය හා අනෙකුත් බලකා නිෂ්පාදනයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු රු. 62,758,801 ක මුදලක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන වාර්තා කර නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොතිබූ අතර, ඒ අනුව හිඟ ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2019, 2020 හා 2021 වර්ෂවල හිඟ හිටි ආදායමෙන් පිළිවෙලින් රු.122,000 ක්, රු. 274,000 ක් හා රු. 147,000 ක් ලෙස හිඟව තිබූ රු.543,000 ක් වූ ආදායම් විවිධ හේතූන්මත ආයතන මඟින් අයකර ගත නොහැකි බව දක්වමින් හිඟ ආදායම් ශේෂ වලින් අඩු කර දක්වා තිබූ නමුත් එලෙස ආදායම් කපා හැරීම හෝ අත්හැර දැමීම මු.රෙ. 113 ප්‍රකාරව සිදු කර තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) 2022 වර්ෂය තුලදී ගිණුම්වල ඇතුලත් වී තිබුණු අක්කර 1 රූඩ් 3 පර්චස් 16.48 ක් වූ කුරගල බලකා පුහුණු පාසල් ඉඩම, සමාලෝචිත වර්ෂයේදී ද නැවතත් ගිණුම්ගත කිරීමෙන් එම ඉඩමේ වටිනාකම වූ රු.1,100,000 කින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපල, පිරියත හා උපකරණ වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අයිතිය පවරාගෙන අවසන් කර තිබූ අක්කර 6 රූඩ් 4 පර්චස් 30.98 කින් යුත් පොළොන්නරුව වැලිකන්ද මූලස්ථාන ඉඩම රු.3,600,000 කට හා පර්චස් 15.4 කින් සමන්විත අම්පාර උහන සමංගල අනුකලාපයේ ඉඩම රු.500,000 කට තක්සේරු කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ ACA 6 තුල ඇතුලත් කර නොතිබුණු අතර, ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම් රු.4,100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයිතිය පවරාගෙන තිබූ බිම් කැබලි 21 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ උපලේඛන තුළ ඇතුළත්ව තිබූ තක්සේරු වටිනාකම් රු.134,124,000 ක් වටිනා වාහන 58 ක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් ACA 6 ප්‍රකාශයේ. ඇතුළත් කර නොතිබූ අතර, ඒ අනුව එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව දෙපාර්තමේන්තුව සතුව පාපැදි 341 පැවති බව දක්වා තිබූ නමුත් එම පාපැදි වටිනාකම් ගිණුම් තුළ ඇතුල්ත් වී නොතිබුණි.

(ඊ) 2022 වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම් රු. 2,314,614,772 ක් වූ අතර 2023 වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ වටිනාකම් රු.1,761,457,769 ක් වූ අතර ඒ අනුව රු. 55,315,703 කින් එම වටිනාකම් අඩු වී තිබුණු අතර, එම වෙනසට හේතුව විගණනයට අනාවරණය නොවුණි.

1.6.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2023 නොවැම්බර් 07 දිනැති අංක SA/SD/1/Circular දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 මගින් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සඳහා භාවිතා කරමින් තිබූ ආකෘති පත්‍ර සංශෝධනය කර තිබූ අතර 2023 වර්ෂයේ අත්තිකාරම් "බී" ගිණුම එම සංශෝධිත ආකෘති පත්‍ර භාවිතා කරමින් පිළියෙල කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් නව ආකෘති පත්‍ර භාවිතා කර නොතිබුණි.

(ආ) මියගිය නිලධාරීන් 44 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,116,395 ක්, විශ්‍රාම ගිය නිලධාරීන් 73 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,855,362 ක්, සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 543 දෙනෙකුගෙන් අයවිය යුතු රු.31,790,606 ක් අයකරගෙන නොතිබූ අතර, ඒ තුල මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.155,492 ක් වූ වර්ෂ 2 ට වඩා පැරණි ණය ශේෂයක් ද, විශ්‍රාම ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,475,631 ක් වූ වර්ෂ 2 ට වඩා පැරණි ණය ශේෂයන් ද, සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 53 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 5 කට වඩා පැරණි රු.4,141,473 ක් වූ ණය ශේෂද, වර්ෂ 4 -5 ත් අතර පැරණි රු.3,484,489 ක් වූ ණය ශේෂද, වර්ෂ 3 – 4 ත් අතර පැරණි රු. 1,820,150 ක් වූ ණය ශේෂද, වර්ෂ 2 – 3 ත් අතර පැරණි රු.2,331,326 ක් වූ ණය ශේෂයන් ද ඇතුලත් වී තිබුණි.

(ඇ) නිලධාරීන් 102 ක ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ අයවීමට පැවති රු.14,904,310 ක් වූ ණය ශේෂ වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වී තිබීමෙන් එම ආරම්භක ණය ශේෂ එලෙසම වර්ෂය අවසානයේදී ද අත්තිකාරම් ශේෂ තුල ඇතුලත්ව තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් එක් එක් නිලධාරීන් වෙනුවෙන් ආරම්භක ශේෂ සහ ඒ ඒ මාසයේ අවකරණය කර ගන්නා ණය මුදල් ප්‍රමාණයන් හා පොළිය සහ දෙසැම්බර් 31 දිනට ණය මුදලේ තවදුරටත් අයවීමට ඇති ශේෂය දක්වමින් CC – 10 ණය හා අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ හා අයකිරීම් සටහන්කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

මූල්‍ය ප්‍රකාශනයන්හි හිඟ ආදායම් පිළිබඳ වාර්තාව අනුව ආරක්ෂක සේවා හා ව්‍යාපෘති මඟින් සේවා ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන්වන විට රු.133,700,136 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට පැවතුණි. ඉන් රු.3,124,678 ක් 2017 වර්ෂයේ ලබාදුන් ආරක්ෂක සේවා වෙනුවෙන්ද, රු.5,719,800 ක් 2018 වර්ෂයේ ලබාදුන් ආරක්ෂක සේවා වෙනුවෙන්ද, රු.247,075 ක් 2020 වර්ෂයේ ලබාදුන් ආරක්ෂක සේවා වෙනුවෙන්ද, රු.1,029,300 ක් 2021 වර්ෂයේ ලබාදුන් ආරක්ෂක සේවා වෙනුවෙන්ද, රු.1,022,600 ක් 2022 වර්ෂයේ ලබාදුන් ආරක්ෂක සේවා වෙනුවෙන්ද ලැබීමට පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන්වන විටද එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව වර්ෂ 01 ත් 06 ත් අතර, කාලයක් ගත වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සඟේතුකව පූර්වානුමාන කළ හැකි සියළුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බවටත් ඒවා මුදල් වර්ෂය තුල තම දෙපාර්තමේන්තුවට ඉටුකල හැකි ශක්තිය ඇති බවටත් හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවටත් ගණන්දීමේ නිලධාරියා වගබලාගත යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරනු ලද ඇස්තමේන්තු වෙනස් කිරීමේ විචල්‍යතාවය සියයට 23 ත් සියයට 133 ත් අතර පරාසයක් දක්වා විහිදී තිබුණි.

(ආ) වැය විෂයයන් 17 ක ප්‍රතිපාදනයන්හි ඉතිරිය සියයට 10 ත් සියයට 100 ත් දක්වා වූ අතර, ඉන් වැය විෂයන් 03 ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු ද ඉතිරි වී තිබුණි. තවද, වැය විෂයන් 05 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වැඩි කරගැනීමෙන් පසු ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය විය.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 හි 3.3 වගන්තිය අනුව වාර්තා කරන ආයතනයේ ඇති බැදීම් සහ වගකීම් 2023/12/31 දිනට බැදීම් අංක අනුව හෙළිදරවු කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ රු.1,201,338 ක් වූ වියදම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරවු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුල හෙළදරවු කර තිබූ රු.124,703,033 ක් වටිනා බැදීම් හා බැරකම් 2024 වර්ෂයේ මාර්තු මස අවසන් වන විටද දෙපාර්තමේන්තුව විසින් පියවා නොතිබුණි.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් වැය ශීර්ෂයකට අදාළව දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ රු.400,000,000 ක ප්‍රතිපාදනවලින් රු.12,924,309 ක ප්‍රතිපාදන භාවිතා නොකර ඉතිරිව පැවතුණි.

2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම්
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 103 සිට මුදල් රෙගුලාසි 110	පොලොන්නරුව බලකායේ 2023 වර්ෂයේ NLDB කෘෂි ව්‍යාපෘතියේ වී සහ බඩ ඉරිහු වගාව විනාශ වීම, පොලොන්නරුව බලකාය යටතේ ඇති මාර්න්කේනි කජු ව්‍යාපෘතියේ කජු වගාව සඳහා යොදා ගනු ලබන Mospilan කෘමි නාශක ද්‍රව්‍ය 100g පැකට් 2603 ක් 2023 ජූලි වන විට කල් ඉකුත් වී තිබීම, පොලොන්නරුව බලකායේ නාඩු වී තොග කි.ග්‍රෑම් 20,019 ක ඌණතාවයක් පෙන්නුම් කිරීම සහ අම්පාර බලකාය යටතේ ඇති ලාහුගල කරංකෝව 2022/2023 මහ කන්නයේ වී වගාව විනාශ වීම යන හානි හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඒවා ලේඛනවල සටහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 756(6)	2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023 වර්ෂයේ ජුනි 15 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කළ බවට පමණක් ලිපියක් ලබාදී තිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 770(4) හා 770 (අ) (ආ)	රාජ්‍ය ආයතනවල අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කල යුතු අතර, එහිදී කාණ්ඩ 03 ක් යටතේ එනම් (i) සුන්බුන් ලෙස පවතින වාහන (ii) ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත් වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන සහ (iii) ධාවන තත්ත්වයේ පවතින එහෙත් භාවිතය ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන හා / හෝ වෙනත් විශේෂ කරුණු මත අපහරණය සඳහා හඳුනාගත් වාහන ලෙස වර්ග කළ යුතුය.

9

නමුත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ධාවනයට අයෝග්‍ය බවට තීරණය කර ඇති වාහන 113 ක ලේඛනයක් ලැයිස්තු ගත කර තිබුණු අතර, 2023 වර්ෂයේ හෝ ඊට පෙර ධාවනයෙන් ඉවත් කළ වාහන මෙම ලේඛනයේ පැවතුණද, යථෝක්ත මුදල් රෙගුලාසිය ප්‍රකාරව බාණ්ඩ ගත කිරීමක් හෝ විගණන අවස්ථාව දක්වා එම වාහන නක්සේරුකර අපහරණය කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ආ) **1985 මැයි 10 දිනැති අංක 289 හා 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.

(ඇ) **2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

එම චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය පදනම් කර ගෙන 2023 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

2.7 අවධිමත් ගනුදෙනු

2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව විසින් මිය ගිය හා විශ්‍රාම ගිය පිළිවෙලින් නිලධාරීන් 56 දෙනෙකුට හා 37 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.1,107,463 ක් හා එම කාලය තුලදී සේවය හැර ගිය නිලධාරීන් 85 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ රු.1,914,647 ක් වූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

2.8 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 91 මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371 (5) අනුව කිසියම් විශේෂිත කාර්යයකට ලබාදුන් අතුරු අග්‍රිමයක් එම කාර්යය නිමකළ විගසම හෝ අදාළ කාර්ය නිමකර දින 10 ක් තුල නැවත පියවිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 65 කදී ලබාදී තිබූ එකතුව රු.5,491,244 ක් වූ අත්තිකාරම් දින 11 ත් දින 323 ත් අතර, ප්‍රමාදයකින් යුක්තව පියවා තිබුණි.

(ආ) ඉහත සඳහන් කරන ලද වක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්ති අනුව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවද, ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 15 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.3,929,350 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි. තව ද, මුල්‍ය සීමාවන් ඉක්මවීමට අවශ්‍ය වන අවස්ථාවලදී ගණන්දීමේ නිලධාරියා විසින් එම අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු සමඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් මඟින් මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීමට පුර්ව අවසරය ලබාගත යුතුත්, අත්තිකාරම් පුර්ව අවසරයකින් තොරව ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) අවස්ථා 10 කදී ලබාගත් රු.323,100 ක අත්තිකාරම් මුදල් වියදම් කිරීමකින් තොරව දින 05 ත් දින 126 ත් අතර කාලයක් නිශ්කාර්යව අත රඳවාගෙන පසුව සම්පූර්ණ අත්තිකාරම් මුදලම, මුදලින් පියවා තිබුණි.

2.9 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ 7042755 බැංකු ගිණුමේ රු.10,172,367 ක් වූ හඳුනානොගත් ලැබීම් අවස්ථා 107 ක් 2024 ජනවාරි 31 දින වන විටත් හඳුනාගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ 7042755 බැංකු ගිණුමේ රු.1,252,809 ක් වූ හඳුනානොගත් ගෙවීම් අවස්ථා 04 ක් 2024 ජනවාරි 31 දින වන විටත් හඳුනාගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ආ) <u>මාර්න්කේනි කපු ව්‍යාපෘතිය</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කපු ව්‍යාපෘතිය අක්කර 187 කින් සමන්විත වන අතර ඉන් අක්කර 155 ක භූමි ප්‍රදේශයක් තුල කපු ගස් සිටුවා ඇති බව සඳහන් වුවද, එම භූමි ප්‍රදේශය නිවැරදි ලෙස මැන සිතියම් ගත කර නොතිබූ බැවින් වගා කර ඇති භූමි ප්‍රමාණයෙහි හා ආදායම් වියදම් ගණනය කිරීමේ නිරවද්‍යතාව තහවුරු නොවිය.

(ii) පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කජු ව්‍යාපෘතියේ කජු ගස් 8,787 ක් ඇති බව සඳහන් වුවද, වර්තමානය වන විට එහි පවතින්නේ කජු ගස් 3,682 ක් වීම හේතුවෙන් කජු ගස් 5,105 ක ඌණතාවයක් වූ අතර එම ඌණතාවය සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 110 ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(iii) ස්මාලෝචිත වර්ෂයේදී කජු අස්වැන්න ලෙස කජු කි.ග්‍රෑ. 2,615 ක් ලැබී තිබූ අතර, ඉන් කි.ග්‍රෑ. 2,306 ක් අලෙවිකර තිබූ නමුත් ඉතිරි කි.ග්‍රෑ. 309 ක ප්‍රමාණය කිසිදු අවසරයකින් තොරව දීර්ඝ කාලයක් ගබඩා කර තබා ගැනීම නිසා වියලි බර කි.ග්‍රෑ. 109 ක් ඉන් අඩු වී තිබූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 33කට ආසන්න වූ අතර රජයට සිදු වී තිබූ පාඩුව රු.59,950 ක් විය.

(iv) කජු වගාව සඳහා භාවිතා කරන මොස්පිලාන් ඇසිටම්ප්‍රිඩ් (Mospilan Acetamiprid) නම් කෘමිනාශක ග්‍රෑම් 100 පැකට් 2,930 ක් 2022 හා 2023 වර්ෂවලදී මිල දී ගෙන තාවකාලික ගබඩාවේ අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර එම පැකට් සියල්ල 2023 ජූලි වන විට කල් ඉකුත් වීම හේතුවෙන් රජයට සිදු වී තිබූ අලාභය රු.3,123,600 කට ආසන්න විය.

(v) පොලොන්නරුව බලකායේ තොග පොතෙන් මාර්න්කේනි උපබලකායට මොස්පිලාන් ඇසිටම්ප්‍රිඩ් (Mospilan Acetamiprid) කෘමිනාශක ද්‍රව්‍ය පැකට් 1,980 ක් නිකුත් කර තිබූ නමුත් එය මාර්න්කේනි උපබලකායේ තොග පොත්වල සඳහන් වී තිබුණේ පැකට් 1,916ක් වීම හේතුවෙන් පැකට් 64 ක ප්‍රමාණයක ඌනතාවක් පැවති අතර, එහි වටිනාකම රු.76,800 ක් විය.

(vi) කජු වගා භූමි තුල යටි වගාවන් ආරම්භ කිරීමට සැලසුම් වාර්තාවක් සකස් කිරීමට උපදෙස් දී තිබූ අතර, ඒ අනුව 2023 මාර්තු 17 දින උප බලකායේ ජ්‍යෙෂ්ඨ නියාමක විසින් සැලසුම් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද, ඒ පිළිබඳ කිසිදු පියවරක් විගණිත දින වූ 2024 මාර්තු 1 වන දිනවන විටත් ගෙන නොතිබුණි.

(vii) පොලොන්නරු බලකායේ මාර්න්කේනි කජු ව්‍යාපෘතිය නිසි ලෙස අධීක්ෂණය සහ නිලධාරීන් සිය රාජකාරී නිසි ලෙස ඉටු නොකිරීම හේතුවෙන් කජු වගා භූමිය තුල වල් බිහි වී කජු ගස් සොයාගත නොහැකි වන පරිදි විශාල කටු පඳුරු හා වගාවට හානි කරන ශාක වැවී තිබීම, වැඩුණු කජු ගස් මැරී තිබීම, හිස් භූමි පිහිටා තිබීම හා නිසි කලට කජු ගස් කප්පාදු කර නොනිබීම යනාදී ලක්ෂණ වගා භූමි භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

(ඇ) NLDB කෘෂි ව්‍යාපෘතිය

(i) පොළොන්නරු බලකායට අයත් ජාතික පශු සම්පත් මණ්ඩලය සතු අක්කර 90 ක් වූ ගල්ලැල්ල ප්‍රදේශයේ පිහිටි භූමියෙහි සිදු කරන ලද කෘෂි ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ වාචික අනුමැතිය ලැබී ඇති බව සඳහන් වුවද, පසුව ලිඛිත අනුමැතිය ලබාදෙන බව සඳහන් වුවත් එවැනි ලිඛිත අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) රු.204,198 ක වියදමක් දරමින් බඩ ඉරිහු බීජ සිටුවා මාස 1 ½ ක් වන විටදී බඩ ඉරිහු පැල කුණුවීමෙන් හා ඇදවැටීමට ලක් වීමෙන් වගාව සම්පූර්ණයෙන් හානි සිදු වී තිබූ බව පොළොන්නරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පෙන්වා දී තිබූ අතර මෙයට ලවණ සහිත මැටි පසක් පවතින මෙම කෘෂි ව්‍යාපෘති භූමිය ආර්ථික බඩ ඉරිහු වගාවක් සඳහා එතරම් සුදුසු භූමියක් නොවන අතර, වී වගාවෙන් ද ඉහළ අස්වැන්නක් බලාපොරොත්තු විය නොහැකි බව පොළොන්නරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පොළොන්නරු බලකායට උපදෙස් ලබා දී තිබියදී එය නොසලකා වගාවට යොමු වීම සහ අවශ්‍ය පොහොර නොමැති වීම, මෙම ඉඩම් කට්ටි ගවපාලනය සඳහා ලඳුබිම් ලෙස වෙන් වී ඇති ඉඩම් බැවින් මනා ජලවහන පද්ධතියක් සැකසීමට නොහැකි වීම හා උල්දිය දැමීම ආදිය හේතු වී තිබූ බවද වැඩි දුරටත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි.

(iii) මෙම ඉඩම පොළොන්නරුව බලකාය විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත නැවත භාර දී තිබූ අතර ඒ වන විට එහි වී සහ බඩ ඉරිහු වගාව සඳහා රු. 1,395,060 ක වියදමක් දරා රු.324,100 ක පමණ ආදායමක් ලබා තිබූ අතර ඒ හේතුවෙන් රු.1,070,960 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි.

(ඈ) ලාහුගල කරංකෝව වී වගා ව්‍යාපෘතිය

(i) අම්පාර බලකායේ ලාහුගල කරංකෝව වී වගා ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලසුම් සමඟ ශක්‍යතා අධ්‍යන වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද, එය පිළියෙල කිරීමට ලබාගත් දත්ත, වගාවට යොදා ගන්නා භූමියේ ස්වභාවය හා අනෙකුත් ස්වභාවික සාධක ගැන නිවැරදි අධ්‍යනයක් සිදුකර ඇති බවට සාක්ෂි එම ශක්‍යතා අධ්‍යන වාර්තාව තුල ඇතුලත් කර නොතිබුණි.

(ii) අම්පාර බලකායේ ලාහුගල කරංකෝව අක්කර 70 ක වී වගා ව්‍යාපෘතියෙන් වී කිලෝග්‍රෑම් 105,000 ක අස්වැන්නක් හා ඉන් රු.12,600,000 ක (105,000

x රු. 120) ආදායමක් ලබාගත හැකි බවට නොරතුරු ඉදිරිපත් කර සැලසුම් අනුමත කරවාගෙන තිබුණද, සත්‍ය ලෙස ලද අස්වැන්න කිලෝග්‍රෑම් 24,500 ක් හා ඉන් ලද ආදායම රු. 1,849,750 ක් වූ අතර ළඟා විය නොහැකි ඉලක්ක ව්‍යාපෘති වාර්තාවලට ඇතුලත් කර ව්‍යාපෘතිය අනුමත කරවාගෙන තිබුණි.

(iii) අම්පාර බලකායේ ලාහුගල කරංකෝව වී වගා ව්‍යාපෘති සැලසුම් අනුව හටයින් 64 දෙනෙකු යෙදවීමට සැලසුම්කර තිබුණද සත්‍ය ලෙස ව්‍යාපෘති කටයුතු සඳහා හටයින් 74 දෙනෙකු යොදවා තිබූ හෙයින් විධිමත් අනුමැතියකින් තොරව වැඩිපුර හටයින් දස දෙනෙකු යොදවා තිබුණි. තවද, ව්‍යාපෘතිය සඳහා රු. 3,988,650 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ දී දරා ඇති අතර මෙම ව්‍යාපෘතියෙන් ලද ආදායම රු.1,849,750 ක මුදලක් බැවින් රජයට සිදු වූ පාඩුව රු. 2,138,900 ක් විය.

3.2 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන අත්පොතෙහි 7.11.1 හි "ලංසු ඇගයීමේ වාර්තාව" යන පරිච්ඡේදය අනුව සියලුම ලංසුකරුවන්ට, තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන පිරිවිතරවලට ලංසුකරුවන්ගේ අනුකූලතාවය පෙන්නුම් කරන වගුවක් ලංසු ඇගයීමේ වාර්තාව තුල ඇතුලත් විය යුතු බව දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.5,907,940 ක වියදමක් දරමින් ප්‍රසම්පාදනයන් හතරක් සිදුකර තිබූ නමුත් එවන් වගුවක් තාක්ෂණික ඇගයීම් වාර්තාවේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (ඇ) වගන්තිය ප්‍රකාරව තාක්ෂණික පිරිවිතර සකසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා ඇඳුම් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී අවම ලංසුකරු හා උපරිම ලංසුකරු ඉදිරිපත් කරන ලද මිල ගණන් අතර, රු.1,328,154 ක් දක්වා විශාල මිල පරාසයක් ඇති වී තිබුණි.

(ඇ) ක්‍රීඩා ඇඳුම් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී ලබාදී තිබූ තාක්ෂණික ඇගයීම් වාර්තාවේ සාමාජිකයන් දෙදෙනෙකු සිය අත්සන් යොදා තාක්ෂණ ඇගයීම් කමිටු තීරණ සඳහා අනුමැතිය ලබාදී නොතිබූ අතර ක්‍රීඩා ඇඳුම් කට්ටල 141 සඳහා භාණ්ඩ ලද පසුව තත්ත්ව පරීක්ෂාවක් සිදු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී රු.2,229,195 ක් වැයකර ග්ලාස් ක්ලීනර් සහ එයාර් ෆ්‍රෙෂ්නර් ස්ප්‍රේ මිලදිගැනීමේ දී ලංසු ලේඛනවල භාණ්ඩ ඒකකයක අඩංගු විය යුතු දියර පරිමාව සඳහන් කර නොතිබීම හේතුවෙන් ලංසුකරුවන් විසින් විවිධ පරිමාවන් සඳහා මිල

ගණන් ඉදිරිපත් කර තිබූ අතර මෙම පරිමාවන් වෙනස් වීම ලංසු ඇගයීමේදී අවධානයට ලක් කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් ගත කර තිබූ ඉඩම් හා,පාලන අංශය සතු ලේඛන සැසඳීමේදී පහත අසමානතා නිරීක්ෂණය විය.

(i) ගිණුම් අංශය විසින් රු. 69,310,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 6 ක පිහිටා තිබූ අක්කර 176 රූඩ් 3 පර්චස් 39.5 ක් ගිණුම් තුල පැවති නමුත් දෙපාර්තමේන්තුව සතුව එවන් ඉඩම් කැබලි 6 ක් නොමැති බව පාලන අංශය ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ii) ගිණුම් අංශය විසින් රු. 198,846,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 4 ක පිහිටා තිබූ ඉඩම් කැබලි 4 ක් අක්කර 121 රූඩ් 2 පර්චස් 33.12 ක් ලෙස දක්වා තිබූ නමුත් පාලන අංශය විසින් ලබා දී තොරතුරු අනුව එම ඉඩම් කැබලි වල මුළු භූමි ප්‍රමාණය අක්කර 33 රූඩ් 2 පර්චස් 35.48 ක් වූ අතර ඒ අනුව අක්කර 88 කින් පමණ භූමි ප්‍රමාණයේ වෙනසක් නිරීක්ෂණය විය.

(iii) හෙක්ටයාර් 2.17 ක සේරුපිට බලකා ඉඩම හා සමෘද්ධි මාවත, පරණමැදවච්චිය, ඇලපාත නමින් අක්කර 4 ක ඉඩමක් ගිණුම් අංශය විසින් රු.13,400,000 හා රු.1,500,000 කට ගිණුම් ගත කර තබූ නමුත් පාලන අංශය විසින් මෙම ඉඩම් සඳහා තක්සේරු වටිනාකමක් පාලන අංශය ලබාදී නොතිබුණි.

(iv) ගිණුම් අංශය විසින් පලුගස්වංගුව, සිරිපුර නමින් රූඩ් 1 පර්චස් 28.4 ක ඉඩමක් රු.513,000 කට ගිණුම්ගත කර තිබූ නමුත් පාලන අංශයේ ලබාදුන් තොරතුරු අනුව ශ්‍රී පුර උප බලකායේ භූමි ප්‍රමාණය දක්වා නොතිබුණි.

(ආ) ගිණුම් ගත කර තිබූ වාහන හා ප්‍රවාහන අංශය සතු ලේඛන සැසඳීමේදී පහත අසමානතා නිරීක්ෂණය විය.

(i) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA 6 ප්‍රකාශයේ රු. 740,456,671 ක් වටිනා ප්‍රවාහන උපකරණ 579 ක් වූ නමුත් ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ වාහන ලැයිස්තුව තුළ වාහන 502 ක් පමණක් ඇතුළත් වී තිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ රු. 100,345,435 ක් වටිනා වාහන 135

ක් ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ උපලේඛන තුල ඇතුළත් කර නොතිබූ අතර, එම වාහන සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

(iii) ප්‍රවාහන අංශය සහ ගිණුම් අංශය යන අංශයන් දෙකෙහිම පැවති වාහන 444 ක් අතුරින් රු.140,135,000 ක් වටිනා වාහන 82 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි.

(iv) ACA 6 තුල ගිණුම්ගත වී නොමැති ප්‍රවාහන අංශය තුල තොරතුරු ඇතුලත් වාහන 58 කින් වාහන 38 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ වාහන 108 ක් පිළිබඳ තොරතුරු ප්‍රවාහන අංශය සතුව නොවිය.

(v) ප්‍රවාහන අංශය තුල විස්තර ඇතුලත් නොවූ ACA 6 තුල ඇතුලත් වූ වාහන 135 කින් වාහන 78 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන උපලේඛනයේ ඇතුලත් වාහන 71 ක් ACA 6 තුල ද ඇතුලත් වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දේපළ, පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(vi) මේ අනුව ප්‍රවාහන අංශය හා ගිණුම් අංශය නඩත්තු කරන ලේඛන දෙක තුලම ඇතුලත් නොවූ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වාහන 128 ක් පැවතුණු අතර, මින් වාහන 108 ක් (ප්‍රවාහන අංශයේ විස්තර නොමැති) දෙපාර්තමේන්තුව තුල පවතින බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(vii) තවද, දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අයිතිය පවරා නොගත් තක්සේරු වටිනාකම රු. 43,410,000 ක් වූ වාහන 40 ක් පවතින බව දක්වා තිබූ නමුත් ඉන් එක් වාහනයක් වූ GA-4428 දරන වාහනය මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියා පදිංචි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 554 කින් 2023 දෙසැම්බර් 31 දිනවන විටත් බිම් කැබලි 30 කට අදාළ හෙක්ටයාර් 21.08675617 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතුකර තිබූ අතර, ඉතිරි බිම් කැබලි 524 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසන්

වන විටත් පවරා ගැනීම් කටයුතු අවසන්කර නොතිබුණි.

(ඇ) විවිධ අමාත්‍යාංශවලට හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 36 ක් දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් තිබෙන නමුත්, එම වාහන වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලස්ථානයට අයත් ජීප් රථයක් 2022 සැප්තැම්බර් 17 දින හුන්නස්ගිරිය ප්‍රදේශයේදී එන්ජින් පද්ධතියට සිදු වූ හානියෙන් රු.323,000 ක පාඩුවක් දෙපාර්තුමේන්තුවට සිදුවූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම පාඩුව අදාළ පාර්ශවයන්ගෙන් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැලිසර උප බලකාය මඟින් පවත්වාගෙන යනු ලබන විශේෂ සහල් ව්‍යාපෘතියෙන් 2021, 2022 හා 2023 යන වර්ෂයන්ට අදාළව බලකා 07 කින් ලබාගත් වී, ධාන්‍ය වර්ග හා අනෙකුත් බලකා නිෂ්පාදනයන්ට අදාළව රු.62,758,801 ක මුදලක් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු වුවත්, 2024 පෙබරවාරි 13 දින වන විටත් එම මුදල් පියවා නොතිබූ අතර එම වටිනාකම් පියවීමට ප්‍රමාණවත් මුදල් හෝ සහල් තොගද, වැලිසර සහල් ව්‍යාපෘතිය සතුව නොතිබුණි.

3.5 පාඩු හා හානි

මිලදී ගෙන තිබූ සනීපාරක්ෂක ද්‍රව්‍ය අයිතමයන් 5 ක් භාණ්ඩයෙහි ලකුණු කළ මිලට වඩා වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු.58,650 ක පාඩුවක් සිදු වී තිබූ නමුත් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, භාණ්ඩ වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමේදී ලැබෙන වෙළෙඳ වට්ටම් ද ආයතනයට අහිමි වී තිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහඔය බලකාය යටතේ බක්කි ඇල්ල අනුකලාපයේ 2010 හා 2012 වර්ෂයන් හි පවත්වාගෙන ගොස් තිබුණු ගඩොල් ව්‍යාපෘතින්හි ඇති වී තිබූ ගඩොල් 762,322 ක ඌණතාවයක් නිසා රු.5,447,590 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.2,255,672 ක් පමණක් අයකර ගැනීමට

දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ නමුත් රු.3,191,918 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන්වන විට තවදුරටත් අයිතිය පවරාගෙන තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණු බිම් කැබලි 524 ක ඉදිකර තිබූ ගොඩනැගිලිවල වටිනාකම රු.746,203,209 ක් විය: තවද මෙසේ පවරා, නොගත් ඉඩමක් වූ විල්පත්තුව බලකායෙහිද සමාලෝචිත වර්ෂයේ නැවතත් ගොඩනැගිලි ඉදිකිරීමක් සිදුකර තිබූ අතර, ඒ සඳහා වැයකර තිබූ මුදල රු.16,156,769 ක් විය.

(ඇ) උහන හා මහඔය බලකාය විසින් 2021, 2022 හා 2023 වර්ෂවලදී දියතලාව යුධ හමුදා පුහුණු පාසලට හා සේවා වනිතා ඒකකයට අළෙවි කරන ලද බලකා නිෂ්පාදනයන් සඳහා අයවිය යුතු රු. 2,263,047 ක මුදල අදාල ආනනයන්ගෙන් අයකර ගෙන ශ්‍රී ලංකා රජයට පියවීමට අදාල බලකා කටයුතු කර නොතිබුණි.

(ඈ) අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව මීලදී ගන්නා ලද ජල නල උපකරණ වර්ග 76 කට අදාළව අයිතම 2,291 ක් වසර 15 කට අධික කාලයක සිට ද, 2021 වර්ෂයේදී ගබඩාවට ල රු.304,400 ක් වටිනා පොලිසැක් උර 2,000 ක් වසර 2 කට අධික කාලයක සිටද, සේරුපිට ගබඩාව තුල නිශ්කාර්යව ගොඩ ගසා තිබුණි. තවද, වැලිසර බලකායේ ගබඩාව තුල වසර 05 ත් 20 ත් දක්වා පැරණි නිකුත් නොවී පවතින නිල ඇඳුම් අයිතම 31 ක් ද, වර්ෂ 02 ත් 08 ත් දක්වා පැරණි නිකුත් නොවී පවතින ටයර් සහ ටියුබ් ඒකක 268 ක් ද, වර්ෂ 04 ත් 11 ත් අතර නිකුත් නොවී පවතින ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි උපකරණ 93 දක් ද, ලිපි ද්‍රව්‍ය, ටෝනර් සහ පරිගණක උපාංග ගබඩාව තුළ විවිධ අයිතම 17 ක ඒකක 26,417 ක් වර්ෂ 05 ත් 13 ත් දක්වා සමාලෝචිත වර්ෂයේ දී, නිකුත් නොවී නිෂ්කාර්යව පැවතුණි. මින් විගණනයට ඉදිරිපත් කරන ලද නිල ඇඳුම් තොග අයිතම 20 ක වටිනාකම රු.5,946,501 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි උපකරණ වර්ග 21 ක වටිනාකම රු.762,809 ක් හා ටයර් හා ටියුබ් ඒකක 195 ක වටිනාකම රු. 2,310,917ක් ද විය.

(ඉ) දෙපාර්තමේන්තුව සතු බලකා, පුහුණු පාසල් හා කාර්යාල මගින් භාවිතයෙන් ඉවත් කරන ලද රථ වාහන 113 ක් අපහරණය කිරීම සඳහා සේරුපිට බලකා මූලස්ථානයේ ගාල්කර තිබූ අතර, මෙම බලකායට මෙම රථ ලැබී ඇත්තේ 2018 - 2023 යන වර්ෂයන්ට අදාළ කාලපරාසයන් තුලදී වේ. මෙම රථ දීර්ඝ කාලයක් අපහරණය කිරීමකින් තොරව ගොඩගසා තිබීම නිසා විශාල ලෙස හානි වීම් හා විනාශ වීම් සිදු වී ඇති බවත්, නියමිත කාල වකවානුවලදී මෙම අපහරණයන් සිදුකලේ නම් රජයට ගතහැකිව තිබූ ප්‍රතිලාභ මේවන විටත් අහිමි වී ඇති බවද නිරීක්ෂණය විය.

විගණිත දිනය වූ 2024 මාර්තු 20 දිනවන විටත් මෙම රථ අපහරණය කිරීමට කටයුතු කර නොනිබුණි.

(ඊ) ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු විසින් බීජ අවශ්‍යතාවය නිසි පරිදි ඇගයීමක් සිදු නොකර බීජ මිලදී ගැනීම ද, නිසිකලට වේලාවට වගා නොකිරීම් හා පසු විපරම් කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.,1,067,202 ක් වටිනා බීජ ප්‍රභේද 8 කින් කි.ග්‍රෑ 2,112.54 'ක් භාවිතයට නුසුදුසු තත්ත්වයෙන් ඉතිරිව පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී ගබඩාව තුල ටෙලරින් චෝල්ක් පෙට්ටි 116 ක් පැවතියදී නිසි ගබඩා කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් නැවතත් ටෙලරින් චොල්ක් පෙට්ටි 110 ක් සඳහා රු.75,900ක් හා වෙනත් භාණ්ඩ අයිතම 31 ක් සඳහා රු. 959,365 ක් ද වැය කරමින් (ගබඩාවේ පවතින තොග තත්ත්වයන් පිළිබඳ නොසලකා හරිමින්) එදිනට අවශ්‍ය ප්‍රමාණයම මිලදී ගෙන එම මිලදී ගත් මුළු තොග ප්‍රමාණයම ගබඩාවෙන් නිකුත් කිරීමට කටයුතු කරනිබූ අතර, ඒ හේතුවෙන් පෙර පැවති තොග ගබඩාව තුල ඉතිරිව පැවතුණි.

(ඌ) ව්‍යාපෘති අංශයේ ලිඛිත නියෝගය පරිදි බලකාවලින් වී නිකුත් කිරීම් කළ යුතු වුවද, එසේ නියෝගයකින් තොරව පොළොන්නරු බලකාය සතු වී කි.ග්‍රෑ. 75,150 ක ප්‍රමාණයක් පෞද්ගලික සහල් මෝලකට නිකුත් කර නිබූ අතර, එහි වටිනාකම රු.7,890,750 ක් විය.

(එ) පොළොන්නරු බලකායේ තොග ලේඛණයන්ට අනුව නාඩු වී කිලෝග්‍රෑම් 98,539 ක් පැවති නමුත් පත්කරන ලද මණ්ඩලය විසින් වී තොග කිරුම් කටයුතු සිදු කිරීමේ දී ගබඩාවේ ඇති සත්‍ය තොගය කිලෝග්‍රෑම් 84,035 ක් වූ අතර වී කිලෝ ග්‍රෑම් 14,504 ක ඌණතාවක් නිරීක්ෂණය වී තිබුණි. එහි වටිනාකම රු1,675,067 ක් විය. තවද, පොළොන්නරු බලකායේ තොග ලේඛණයන්ට අනුව සම්බා වී කිලෝ ග්‍රෑම් 11,054 ක් පැවති නමුත් පත්කරන ලද මණ්ඩලය විසින් වී තොග කිරුම් කටයුතු සිදු කිරීමේ දී ගබඩාවේ ඇති සත්‍ය තොගය කිලෝග්‍රෑම් 11,585 ක් බව සඳහන් කර නිබූ හෙයින් සම්බා වී තොග කිලෝග්‍රෑම් 531 ක අතිරික්තයක් පෙන්නුම් කල අතර, එහි වටිනාකම රු. 55,746 ක් විය.

ජේ. සුනිල් ශාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

Description	Date	Sig
DG		
ADG		
D Admin		
D Proj/ Media		
DPA		
D Log		
CA		
D Ops		
D Trg		
D Tpt		
D Wel		
OIC SIU 19		
CO HQ		
DG Sec		
DG Asst/ Sec		

4 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදිරි ව්‍යාපෘති හා සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම.		√	
තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ප්‍රකාශිත ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම		√	
දෙපාර්තමේන්තු පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම	√		
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව)		√	
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කෘෂි, පශු හා විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත නිෂ්පාදන / අස්වනු ඉලක්ක සපුරා ගැනීම හා අපේක්ෂිත ආදායම මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම.		√	
විවිධ ඉදිකිරීම්, සිද්ධස්ථාන හා පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂක නඩත්තු, සංරක්ෂණ, නගර අලංකරණ ආදී වශයෙන් පැවරෙන ව්‍යාපෘතීන් නිසි පරිදි ඉටුකිරීම.		√	

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්කය / දර්ශකය	2023 භෞතික ප්‍රගතිය	2023 වර්ෂයේ ජයග්‍රහණලබා ගැනීමේ ප්‍රතිශතය		
				0%-49%	50%-74%	75%-100%
1	2	3	4	5		
2.C **සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම**	1. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම	i. වාර්ෂිකව වී, එළවළු, බඩඉරිඟු, කජු, දේශීය අඹ, විවිධ ධාන්‍ය, කුළු බඩු වගා කිරීම. කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන කිරීම	a.වගාකළ අක්කර ගණන/බෝග වශයෙන් වී/අඳ වී - අක්කර 7,416.75 බඩඉරිඟු - අක්කර 498 කවුපි - අක්කර 218 කුරක්කන් - අක්කර 236 උඳු - අක්කර 291.5 තල - අක්කර 297 රටකජු - අක්කර 302.5 ස්ථීර බෝග - අක්කර 4717.5 මිරිස් - අක්කර 33.5 වෙනත් බෝග - අක්කර 183 වාර්ෂික බෝග - අක්කර 693.25 b.ඵලදාව කිලෝ ගණන/බෝග වශයෙන් වී - කි.ග්‍රෑ 6,089,524 බඩඉරිඟු - කි.ග්‍රෑ 146,408 කජු - කි.ග්‍රෑ 57,793 කවුපි - කි.ග්‍රෑ 7,911 කුරක්කන් - කි.ග්‍රෑ 49,065 උඳු - කි.ග්‍රෑ 44,974 තල - කි.ග්‍රෑ 46,879 මුං ඇට - කි.ග්‍රෑ 3,038 රටකජු (අමු) - කි.ග්‍රෑ 2,377 රටකජු (වියලි) - කි.ග්‍රෑ 67,741 වෙනත් භෝග - කි.ග්‍රෑ 3,529 මිරිස් - කි.ග්‍රෑ 99,581 වට්ටක්කා - කි.ග්‍රෑ 11,633 වෙනත් - කි.ග්‍රෑ 82,861			✓

3.5 **හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාර ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම**	7. මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම වැළැක්වීම	ii. වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 30 ක් දිවයින පුරා පිහිටා ඇති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු බලකා විසින් පවත්වා ඇත.			✓
4.1. **2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන පරිදි සියලු ගැහැණු හා පිරිමි ළමයින් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපනයක් සම්පූර්ණකර සිටින බව තහවුරු කිරීම**	7. දිවයිනේ ගුරුවරුන් හිඟ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පාසල් වල ගුරුවරුන් ලෙස දැනුම හා නිපුණතාව ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කරවීම.	V. 2025 වන විට ගුරු හිඟතා ඇති දිවයිනේ සියළුම පාසල් වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව මත නිසි පූහුණුව හා නිපුණැති ගුරුවරුන් අනුයුක්ත කරවීම සහ එමඟින් සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම.	මේ යටතේ පාසල් විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138 ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 183 ක් අනුයුක්ත කර ඇත.	✓	
	8. සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය තුළ පෙර පාසල් දරුවන් සඳහා දිවා සුරැකුම් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම	Vi. 2025 වන විට සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය 750 දක්වා තවදුරටත් ව්‍යාප්ත කර තවත් දරුවන් 5000කට පමණ පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන පහසුකම් ලබාදීම.	මේ යටතේ පෙරපාසල් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 553ක් ක්‍රියාත්මක කර ඇත. ඒ මඟින් දරුවන් 12,793ක් වෙත අධ්‍යාපනය හා රැකවරණය ලබා දී ඇති අතර, ඒ සඳහා ගුරුවරු ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 1,150ක් අනුයුක්ත කර ඇත.		✓
	9. සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන්ගේ පාසල් යන වයසේ සෑම දරුවකුටම අවශ්‍ය අභ්‍යාස පොත් කට්ටලයක් බැගින් වාර්ෂිකව ලබාදීම.	Viii. 2025 වන විට සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ගේ හා ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම.	සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් 39306 කට නව වසරට අවශ්‍ය පාසල් පොත් 136,998ක් බෙදා දී ඇත.		✓

<table>
<tr>
<td>6 b.
ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය, දිරිගැන්වීම සහ සහාය ලබා දීම</td>
<td>1.
දිවයින පුරා ගොඩ වූ වැව් නැවත සැකසීම සහ අපවිත්‍ර වූ වැව් පිරිසිදු කර පිළිසකර කිරීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම.</td>
<td>i.
ගොඩ වූ හා අපවිත්‍ර වූ වැව් මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි සහ කෘෂිකර්මාන්තයට යොදා ගත හැකි ලෙස පිළිසකර කිරීම.</td>
<td>2023 වර්ෂයේදී වැව් පිළිසකර කර නැත.
එසේ නමුත් වකුගඩු රෝගය බහුලව පැතිර යන ප්‍රදේශයන්හි පහත දක්වා ඇති ආයතන මඟින් ස්ථාපනය කර ඇති ජල පෙරණ යන්ත්‍ර 417 ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් 573 දෙනෙකු යොදවා දිවා රාත්‍රී පිරිපහදු ජලය ලබා දීම සිදුකර ඇත.
<table>
<tr><th>ආයතනය</th><th>ශ්‍රී ලංකා නාවික හමුදා ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>ශ්‍රද්ධාරූප වාහිනියේ ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>වෙනත් ජල පිරිපහදු මධ්‍යස්ථාන</th></tr>
<tr><td>මධ්‍යස්ථාන සංඛ්‍යාව</td><td>313</td><td>84</td><td>20</td></tr>
<tr><td>භට සංඛ්‍යාව</td><td>405</td><td>136</td><td>32</td></tr>
</table>
</td>
<td></td>
<td>✓</td>
<td></td>
</tr>
</table>

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

- මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය අනුව, එකී කාර්යන් කිනම් තිරසර සංවර්ධන ඉලක්කයන් හා සැසඳෙන්නේ ද යන වග හඳුනා ගැනීම.

- එම කාර්යන්, අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා තවදුරටත් සෘජුව සහසම්බන්ධ කර ඊට තිරසර සංවර්ධන ඉලක්ක මුලික කර ගත් නව මුහුණුවරක් ලබා දීම.

- හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත ලබා දුන් උපදෙස් ප්‍රකාරව සැලසුම් සකස් කිරීම, එම සැලසුම් වාර්ෂිකව සැලසුම් වාර්තාවට ඇතුළත් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කරවීම.

- ඉහත 5.1 ඡේදයෙහි හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු අතුරින් මෙම දෙපාර්තමේන්තුවේ සෘජු රාජකාරී වපසරිය තුළ නීතිය හා සාමය සුරැකීම, දිළිඳු බව පිටුදැකීම වැනි අරමුණු කිහිපයක් 75% ක පමණ ප්‍රතිශතයකින් ඉටු කිරීමට හැකි වීම.

5.2.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව විශාල ශ්‍රම බලකායකින් සමන්විත දෙපාර්තමේන්තුවකි. එම ශ්‍රම බලකායට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සරිලන හා විධිමත් ලෙස පවරාගත හැකි ඉඩම් නොමැතිකම එක් අභියෝගයකි.

- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරගෙන යාමේදී හදිසි සම්පත් ඌනතාවන් ඇති වීම සහ අනපේක්ෂිත ව්‍යවසනවලින් ඇති වන බලපෑම් තවත් එක් අභියෝගයකි.

- තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම සඳහා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර ප්‍රකාශනයන්හි සිට සියලුම ආයතනික පරිපාටින්, සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා අනුගතවීමට යම් කාලයක් වැය වීම.


- මෙම සංකල්පය මෑතක සිට හඳුන්වාදුන් නව වැඩපිළිවෙලක් බැවින් පුර්ව අත්දැකීම්, දැනුම සහ යටිතල පහසුකම් සපයා ගැනීමට හැකි වන සේ මෙම සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක වන ආයතනික පුර්වදර්ශයන්හි හිඟතාව.


- තිරසර සංවර්ධන ජාතික වැඩපිළිවෙල තුළ එක් එක් ආයතනය වෙත පැවරෙන ඉලක්ක කවරේද යන්න, එම ඉලක්ක අන්තර් සම්බන්ධීකරණයට හා ඉටු කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික මට්ටමින් පුළුල් සංවිධනාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක නොවීම මත එක් එක් ආයතන මෙම වැඩසටහන තුළ හුදකලා වීම.

6 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)*
ජ්‍යෙෂ්ඨ	23	16	7
ද්විතියික	84	73	11
තෘතීයික	126	67	59
ප්‍රාථමික	39,960	32,936	7,024
එකතුව	40,193	33,092	7,101






6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවට නව බඳවාගැනීම් සිදු නොකරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව දැනට මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 10 කට ආසන්න කාලයක් තිස්සේ නිලධාරීන් විශ්‍රාම යෑම, මියයෑම, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහකිරීම් යනාදී වශයෙන් කාර්ය මණ්ඩලයේ සිදු වන අඩු වීම් ප්‍රතිපූර්ණය නොවන ක්ෂය වන දෙපාර්තමේන්තුවක් බවට පත් කර ඇත.

ඒ අනුව තාක්ෂණික, සෞන්දර්ය, ක්‍රීඩා, පරිගණක, කාර්මික වැනි විෂයන් තුළ හටයන් කැපවීමෙන් හා දැඩි පුහුණුවෙන් අත්පත් කරගත් දෙපාර්තමේන්තු කීර්තිනාමය හා ප්‍රමිතිය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමට බාධාවන් මතු වී ඇත. විශ්‍රාම යාම, මියයෑම වැනි හේතූන් නිසා නිපුණැති නිලධාරීන්ගේ දැනුම අහිමි වීමත්, එම හිඟයට අලුතින් බඳවාගැනීම් සිදු කළ නොහැකි වීමත් ඊට හේතුවයි.

අවම වශයෙන් උක්ත දක්වා ඇති විෂයන් සඳහා සීමාවන්ට යටත්ව හෝ නවක නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කර ඇති ඉල්ලීම් සඳහා අනුමැතිය ලැබෙන්නේ නම්, එකී කාර්යසාධන රික්තය සාධනීය ලෙස අවම කර ගත හැකි වනු ඇත.

දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය තුළ, උක්ත කි පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉතා අත්‍යවශ්‍ය හා කඩිනම් අවධානය යොමුවිය යුතු කාරණාවක් බව වැඩිදුරටත් පෙන්වා දෙමු.



6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
කෘෂි බීජ නිෂ්පාදන වැඩමුළුව	30	2023.02.14 සිට 2023.02.16	175,725.00	-	දේශීය	පුහුණුව හා හැකියාව වර්ධනය
ගබඩාකරණය පිළිබඳ පාඨමාලාව (නිපුණතා සංවර්ධන අරමුදල)	83	2023.03.31 සිට 2023.04.02	225,000.00	-	එම	එම
රජයේ ආයතනවල වියදම් හා ගෙවීම් පිළිබඳ අනුමත පටිපාටි රෙගුලාසි සබැඳිව - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	5	2023.05.30	54,000.00	-	එම	එම
Government payroll System - මිලෝදා ආයතනය	5	2023.05.24 සිට 2023.06.02 හා 2023.06.07 දක්වා	90,000.00	-	එම	එම
ආයතන සංග්‍රහය පිළිබඳ රෙගුලාසි සම්බන්ධ ලිපිකරු පාඨමාලාව නිපුණතා සංවර්ධන අරමුදල	4	2023.06.27	43,000.00	-	එම	එම
හදිසි ආපදා තත්ත්වයකදී ගංවතුර ආශ්‍රිතව මෘදවා ගැනීම හා සහන සැලසීම පිළිබඳව තාක්ෂණික පාඨමාලාව - නාවික හමුදා මූලස්ථානය	40 (අදියර I, II - 20 දෙනා බැගින්)	2023.09.01 සිට 2023.09.07 දක්වා හා 2023.12.04 සිට 2023.12.10 දක්වා	579,735.00	-	එම	එම
ගිනි නිවීමේ පාඨමාලාව - සේරුපිට	39	2023.09.14 සිට 2023.09.16 දක්වා	5,360.00	-	එම	එම
ආයතන සංග්‍රහය පිළිබඳ රෙගුලාසි සම්බන්ධ ලිපිකරු පාඨමාලාව නිපුණතා සංවර්ධන අරමුදල - මූලස්ථානය - SKILL DEVELOPMENT FUND LTD	48	2023.08.21 සිට 2023.08.22 දක්වා	456,000.00	-	එම	එම
පරිගණක ඉංජිනේරු තාක්ෂණ පුද්ගලික සමාගම ICET CERTIFIED MASTER පාඨමාලාව	2	2023.07.09 සිට මාස 06ක්	140,000.00	-	එම	එම
ආයතන සංග්‍රහය පිළිබඳ රෙගුලාසි සම්බන්ධ ලිපිකරු පාඨමාලාව නිපුණතා සංවර්ධන අරමුදල - මූලස්ථානය, ගල්කිරියාගම, පහළලන්ද	218	2023.10.07 සිට 2023.10.10 දක්වා සහ 2023.10.14 සිට 2023.10.16 දක්වා	544,863.00	-	එම	එම

Prag Institute හාණ්ඩ සමීක්ෂණ පාඨමාලාව	1	2023.10.26	13,500.00	-	එම	එම
නියාමක/ උප නියාමක සංස්කරණ පාඨමාලාව	140	2023.06.12 සිට 2023.06.25 දක්වා	නැත	-	එම	එම
නියාමක/ උප නියාමක සංස්කරණ පාඨමාලාව	246	2023.06.12 සිට 2023.06.23 දක්වා	නැත	-	එම	එම
ඉංග්‍රීස්පාඨමාලාව ගල්ගමුව ප්‍රගීත් අධ්‍යාපන ආයතනය - වැලිඔය බලකාය	71	මාස 03	106,500.00	-	එම	එම
කොහු ආශ්‍රිත නිෂ්පාදන වැඩමුළුව	43	2023.10.17 සිට 2023.10.20 දක්වා	26,000.00	-	එම	එම

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ යුද සමයේ තර්ජිත ගම්මාන ආරක්ෂා කර ගනිමින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමයි. ඒ අනුව කාලීන අවශ්‍යතාව මත අධ්‍යාපන, වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් ඇගයීමකින් තොරව අදාළ ප්‍රදේශයන්හි පදිංචි පුද්ගලයන් යන පදනමින් පමණක් ඔවුහු සේවයට බඳවා ගෙන ඇත. එසේ හෙයින් ඔවුන් අනෙකුත් සන්නද්ධ හමුදා හා පොලිස් සාමාජිකයන්ට සාපේක්ෂව වෘත්තීය හා තාක්ෂණික දැනුමින් අඩු ධාරිතාවක පිරිසක් විය. එසේ නමුත්, යුද විජයග්‍රහණයෙන් පසු විධිමත් විෂය නිර්දේශයක් හා කාල සටහනක් යටතේ දෙපාර්තමේන්තු පුහුණු පාසල් තුළින් ඔවුන් වෙත මූලික හා නායකත්ව පුහුණු ලබා දෙන ලදී. එමගින් ඔවුන් අනෙකුත් හමුදාවන්ට සමාන ආචාරශීලී, විනයගරුක හා වෘත්තීය හමුදාවක් බවට පරිවර්තනය කර ගැනීමට හැකි විය. තවද හමුදා සංග්‍රාම, සරඹ, තූර්ය වාදන, සෞන්දර්ය, තාක්ෂණ වැනි විෂයන්හි වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූලව ඔවුන්ට ලබාදෙනු ලබන පුහුණුව තුළින් හමුදාවක් ලෙස ඔවුන්ගේ ධාරිතා වර්ධනය අපේක්ෂා කෙරේ.

- දෙපාර්තමේන්තුවට අනුමත උසස් කිරීමේ පරිපාටිය අනුව, සේවයේ ස්ථීර වීමට හා ඉදිරි උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට මූලික හා නායකත්ව පුහුණු සපුරා තිබීම අනිවාර්ය වේ.

- බාහිර වෘත්තීය පුහුණු ආයතන වෙතින් විවිධ වෘත්තීය පුහුණු ලබා දීම තුළින් සිවිල් ආරක්ෂක සාමාජිකයන් සේවයෙන් විශ්‍රාම ලැබූ පසු වුව ද තම දැනුම හා පරිචය භාවිතයෙන් විවිධ කර්මාන්තයන්හි ස්වයං රැකියාවක නියැලීමෙන් අතිරේක අදායමක් ලැබිය හැකි වනු ඇත.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි විවිධ බාහිර ආයතන වෙතින් හා සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සම්පත් දායකයන් වෙතින් ඔවුන් වෙත ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, ප්‍රසම්පාදන සංග්‍රහය, රජයේ ආයතනික ගිණුම්කරණය, වැටුප් සැකසීම, විගණනය, කාර්යාලයීය කාර්ය පරිපාටි, දෙවන භාෂා පාඨමාලා යනාදී වශයෙන් විවිධ පුහුණු ලබා දීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

7 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	මෙය භාවිතා කිරීමක් සිදු නොවේ.	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.	-	-

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.	ගර්හිත වන වාහන අපහරණය කිරීම සඳහා අවැසි ඉදිරි කටයුතු ඉතා වේගවත්ව සිදුකල ද ක්‍රියා පටිපාටියෙහි පවතින දුර්වලතා මත යම් යම් ස්ථාන තුල කාර්ය ප්‍රමාද වනු දැකිය හැක.	අපහරණ ක්‍රියා පටිපාටියෙහි පවතින දුර්වලතා හඳුනාගෙන ඊට පිළියම් යෙදීම තුල මෙම තත්ත්වය මග හරවා ගත හැක.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-	අනුකූල නොවේ	කල්බදු ගෙවනු ලබන වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැත.

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	නිරවුල් කරමින් පවති	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	වර්ෂය අවසාන විමට පෙර පියවා ඇත	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.	-	-

අවසානය.

කාර්යසාධන වාර්තාව - 2023		
අනුමැතිය		
එයාර් වයිස් මාර්ෂල් ආර්.එස්.බියන්විල	අධ්‍යක්ෂ ජනරාල්	
සංස්කරණ හා ප්‍රතිශෝධන කමිටු සාමාජිකයින්		
කර්නල් එච්.ඒ.ඩී.එම්.සරත්චන්ද්‍ර	අධ්‍යක්ෂ (පුහුණු)	සභාපති
ලුතිනන් කර්නල් ඒ.අයි.හෙට්ටිආරච්චි	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන)	සාමාජික
ලුතිනන් කර්නල් එම්.ඒ.චමින්ද ගුණරත්න	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පිරිස් පාලන)	සාමාජික
ලුතිනන් කර්නල් ඩබ්.ඒ.එල්.ඒ.කුමාර	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	සාමාජික
වී.ආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)	සාමාජික
අධීක්ෂණය හා මෙහෙයවීම		
රියර් අද්මිරාල් ඩබ්.ඩී.ඊ.එම්. සුදර්ශන (විශ්‍රා)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	
බ්‍රිගේඩියර් ඩබ්.එම්.එස්.එන්.ඇරැගොඩ	අධ්‍යක්ෂ (පාලන)	
ලුතිනන් කර්නල් ඩී.එම්.මංජුල සුභසිංහ	අණදෙන නිළධාරි - මූලස්ථානය	
කෙටුම්පත්කරණය, සැකසුම හා පරිගණක යතුරු ලියනය		
ආර්.කේ.කේ රත්නදේවි	කාන්තා උප නියාමක	